
# භක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 මාර්තු - අප්‍රේල් | 125 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | DOP/NEWS/01/2024



# ආදර මගෙ ජේසුනී...

ගී පද - රුකාන්ත ගුණතිලක
තනු නිර්මාණය - රුකාන්ත ගුණතිලක
ගායනය - රුකාන්ත ගුණතිලක

**ආදර මගෙ ජේසුනී - කලකින් ඔබ අමතමී**
**කොහොමද ඔබගේ තතු සමිඳේ**
**සිතූ සිතූ දේ මම කළා - ඔබෙ දහමේ ගුණ නසා**
**අද ඔබ ළඟ වැඳ වැටී හඬමී**
**මා හසුවී මාරුතේ - මඟ වැරදී මාවතේ**
**මේ ලියමන ලියමි මා සමිඳේ**
**මහ කරුණා සාගරේ - ඔබ පමණයි ආදරේ**
**සැනසුම මට දෙන්නකෝ සමිඳේ**
**ජේසුනි මම ආදරෙයි - ඔබෙ පෙම ඊටත් වැඩියි**
**සැමදා මම ණයගැතියි ඔබට**
**ඔබ දුන් හැම දේටමත් - මට දුන් නැති දේ හටත්**
**තුති පුදනෙමි ආදරෙන් සමිඳේ**
**ආදර මගෙ ජේසුනී - හමුවෙමු යළි මතු දිනේ**
**දින දින වැජඹේ ලොවේ සමිඳේ**
**සිතූ සිතූ දේ මම කළා - ඔබ අනුකම්පා කළා**
**මම ඔබ ළඟ වැඳ වැටී හඬමී**
**හමුවෙමු යළි මතු දිනේ**
**දින දින වැජඹේ ලොවේ සමිඳේ**
**සිතූ සිතූ දේ මම කළා**
**ඔබ අනුකම්පා කළා**
**මම ඔබ ළඟ වැඳ වැටී හඬමී**

රුකාන්ත ගුණතිලක ගායකයාණන්ගේ 'ආදර මගේ ජේසුනී' ගීතය, සරල වුවත් සිතට ළෙන්ගතු බස්වහරකින් ලියැවුණු නිසාම අතිශය ජනාදරයට පත්ව ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ. බාහිරින් ගත් කල, එය ජේසුස් වහන්සේට රචිත ලිපියක් සේ දිස්වූවත්, මෙම ගීතය වනාහී පසුතැවිලි වන පව්කාරයකු ජේසුස් වහන්සේට කරන්නාවූ අවංක වූත් අව්‍යාජ වූත් යාච්ඤාවකි. කිතුනු දේව වන්දනාවේ සහ යාච්ඤාවේ පරම අරමුණ වන්නේ දෙවිඳුන් වෙතට අප සිත් ඔසවා තැබීමය. ඇදහිලිවන්තයකුට නම්, එය ප්‍රේමයේ සංවාදයකි. රචකයා 'ආදර මගේ ජේසුනි' යනුවෙන් සමිඳාණන් වහන්සේව අමතන්නේ එබැවිනි.

**සිතූ සිතූ දේ මම කළා - ඔබෙ දහමේ ගුණ නසා**
**අද ඔබ ළඟ වැඳ වැටී හඬමී**

උන්වහන්සේ කරුණාබර පියාණන් කෙනකු මෙන්, අප කොයි තත්ත්වයේ කොතැන සිටියත්, සිත හරවා ගෙන අප හැරී එනතුරු මඟ බලා සිටින සේක.



රචකයාගේ අත්දැකීමද එය වේ. ලූක් සුවිශේෂයේ 18 පරිච්ඡේදයේ සඳහන් පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාවේ එන අයකැමියා මෙන් ඔහු සිය ඇත්ත ස්වභාවය එලෙසින්ම සමිඳුන් ඉදිරියේ පිළිගනියි. ඒ අවංක පසුතැවීමේ බාහිර සලකුණක් වන්නේ ඔහුගේ නෙතින් හැළෙනා කඳුළු බිඳු ය.

පාපය සහ පාප පරීක්ෂාව ඉදිරියේ මනුෂ්‍යයා සැබැවින්ම දුර්වලයෙකි. යක්ෂයා, ලෝකයා සහ මාංසයා ඔහුව සියුම් ලෙස සිය අණසකට නතු කර ගනී. තමන්ද නපුරාගේ මේ රුදුරු උගුලට හසුවී සිටි බව ඔහු පවසන්නේ ඉතා කාව්‍යාත්මක විලාසයෙනි: මා හසුවී මාරුතේ - මඟ වැරදී මාවතේ.

සමිඳුන් ඉදිරියේ සිත විවර කළ මේ "ගැලවුණු පව්කරු" අත්දකින්නේ ඉමහත් ඇතුළාන්ත ප්‍රීතියකි. නිදහසකි. ඒ ප්‍රීතිය සහ නිදහස කෙතරම්දයත්, ඔහු සිය දිවියේ ලැබුණු දෙයට පමණක් නොව නොලැබුණු දෙයටත් සමිඳුන්ට තුති පුදයි. සැබෑ කිතුනු ඇදහිලිවන්තයාගේ අවසන් ජීවිත පරමාර්ථය වන්නේ මේ ලෝකයේ කිසිවක් අයිති කර ගැනීම නොව, දිනක දෙවිඳුන් හා ස්වර්ගයේදී එක්ව විසීමය. එම උදාර වූත් ශ්‍රේෂ්ඨ වූත් අරමුණ පෙරදැරි කරගනිමින් රචකයා සිය 'ලියමන' ලියා අවසන් කරයි: ආදර මගෙ ජේසුනී - හමුවෙමු යළි මතු දිනේ.

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා**
**'මැසනඩ් යොවුන් පියස', සා. විසෙන්ති නිවාසය, මග්ගොන.**

# භක්ති ප්‍රබෝධනය

**2024 මාර්තු - අප්‍රියල්**

ප්‍රකාශනය
නිර්මල මරිය නිකාය

භාරකරු
අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

සංස්කාරක
ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

සංස්කරණ සහාය
රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

කවර නිර්මාණය
අචල රූපසිංහ

පරිගණක පිටු සැකසුම
ආනන්ද නාගහගේ

මුද්‍රණය
කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.

## පිටුවෙන් පිටුව..........

2 කවරයේ කථාව
3 හෙළිදරව්ව
5 හලාවත පදවියේ සිව්වන රදගුරුතුමා ...
- ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා
6 දිව්‍ය පූජාවේ දේව ධාර්මික හරය
- ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා
12 රහසේ පියමනිනා - සුදු පවුලේ පැවිදි ...
- නීතිඥ නවීනා වර්ණකුල
13 දේව ප්‍රසාද නිධාන හා බැඳී පවතින කිතුනු ...
- ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමා
15 අමිතගේ හද ගැස්ම - සී. අමිත
16 **Worship And Life : Pauline Perspective**
- Rev. Fr Andrias Fernando O.M.I.
17 ජුබිලි වසර ඇරඹුණා
- පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව
18 අඛණ්ඩ යැදුමක් කළ ප්‍රාතිහාර්යය
- පුෂ්පමාල් ප්‍රනාන්දු - කඳවල
20 **යාම යැදුම** - ගරු ජෝශප් ඉන්දික පියනම
21 සෙනහසින් ආරාධනා ....
22 මෝසැසි පෙරේරා මාහිමි
- ගරු බෙනඩික් ජෝසප් පියතුමා
24 චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා
25 කැමිලස් මහතා දිවි ගමනට සමුදෙයි
- ටී. සුනිල් ප්‍රනාන්දු සහ රූපස් ප්‍රැන්සිස්
26 පුංචි විකුම් - නිසංසලා සඳමාලී, වෙන්නප්පුව
27 ප්‍රහේලිකා අංක - 78
- ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා
28 ප්‍රහේලිකා අංක 76 පිළිතුරු
29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය I
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය
31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
- එස්. හේමාල් පෙරේරා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළවන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගේ අභිමතය තුළ කළා වූ ජීවිත පූජාව පාස්කු අභිරහස මතු කරයි. වර්තමාන කතෝලික විශ්වාසකයන්ගේ දේව වන්දනාවේ පදනම ඒ ජීවිත පරිත්‍යාගයයි.

දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන සහ යාම යැදුම සෘජුවම පාස්කු අභිරහස හා බැඳේ. දේව වන්දනාවෙ මූලිකම වර්ගීකරණයට අයත් වන මේ ශුද්ධ වූ යාච්ඤා සහ පිළිවෙත් අද කවරයේ කථාවෙන් කියැවෙයි.

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

### භක්ති ප්‍රබෝධනය

දායකත්වය වසරකට - රු. 850.00
(නව මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00
(නව මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com

### BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year
(Including new Postage)

Rs. 1700.00 for two years
(Including new Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

# දේව වන්දනා ජීවිතය

# හෙළිදරව්ව

සෑම ආගමකම බැතිමත්හු ඒ ඒ ආගම්වලට අනුකූල වූ වන්දනාමානවල නිරත වන්නෝය. කතෝලිකයන් වන අපට, කතෝලික සභාව නිල වශයෙන් ස්ථාපිත කළ දේව වන්දනාවක් ඇත. දශක කීපයක් පුරාම කතෝලිකයන් දෙවියන් වහන්සේට කරන වන්දනාව "ජනවන්දනාව" ලෙස නම් කර තිබුණි. එහෙත් මෑතක සිට "ජනවන්දනාව" යන වචනය අනුක්‍රමයෙන් ඉවත් වෙමින් ඇත. අපි ඒ වෙනුවට "දේව වන්දනාව" යන වචනය භාවිත කරමු. පෙර කළ වන්දනාව "ජනවන්දනාව" ලෙසත් එයම, අද කළත් "දේව වන්දනාව" ලෙස වචනය වෙනස් කර ඇත්තේ මන්ද යන්න බොහෝ දෙනා ප්‍රශ්න කළත් ඊට සැබෑ අවබෝධයක් ඇති වන අයුරින් හේතු සාධක පහදා දීමට බොහෝ දෙනා අසමත් වී ඇත. එබැවින් එම වන්දනාව "ජනවන්දනාව" ලෙස එවකට නම් කළේ මන්ද ? එය අද දේව වන්දනාව ලෙස අමතන්නේ ඇයිද යන්න පහදා ගනිමු.

"Liturgy" (ලිටජි) යන ඉංග්‍රීසි වචනයේ තිඹිරි ගෙය ග්‍රීක් භාෂාවේ "ලාඕස්" (Laos) සහ එර්ගොන් (Ergon) යන වචන වලින් සෑදුණකි. ලාඕස් යනු ජනතාවයි (people). එර්ගොන් යනු කිසියම් කාර්යයි (work). ඒ අනුව "ලෙයිටුර්ජියා" හි මුල් අරුත ජනතාවගේ කාර්යයි. එබැවින් ඒ කාලයේ පැවති ප්‍රසිද්ධ ක්‍රීඩා, සංවිධාන, මංගල්‍ය, මිලිටරි සහ අනිවාර්ය රාජ්‍ය සේවාව වැනි පොදු සේවා පවා "ලෙයිටුර්ජියා" ලෙස නම් කෙරුණි. ඒ අනුව පදගතාර්ථයෙන් සනිටුහන් කෙරෙන "ජනවන්දනාව" යන වචනය භාවිතයට පැමිණියේය. බැලූ බැල්මට බාහිරව එහි අඩුවක් නැති බව පෙනුණත් අපගේ දහමේ අති උතුම් ධර්ම ඉගැන්වීම් (අභිධර්මය) දෙස බැලීමේදී ඇත්තෙන්ම මෙය ජනතාවගේ වන්දනාව පමණක්ද ? ජනතාව දෙවියන් වහන්සේට කරන වන්දනාවේ පදනම සහ කේන්ද්‍රීය සාධකය කුමක්ද යන්න අවබෝධකර ගැනීමට කතෝලික සභාවේ නිල ප්‍රකාශන මෙයට උපකාරී වේ.

1947 එවකට සිටි 12 වන පියුස් ශුද්ධෝත්තම පියාණන් විසින් නිකුත් කරන ලද විශ්ව චක්‍ර ලේඛනයක් වන "Mediator Dei" - "මීදියාතෝර් දේයි" (දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ) යන විශ්ව ලේඛනයත්, 1963 දේව වන්දනාව පිළිබඳ දෙවන වතිකාන සමුළුවේ වේද සත්‍ය ව්‍යවස්ථාව ("Sacrosanctum Concilium" (SC) සක්‍රොසාන්ක්තුම් කොන්චීලියුම්) යන ලේඛන අධ්‍යනය කිරීමේදී ජනතාව දෙවියන් වහන්සේට කරන වන්දනාවට පදනම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කු අභිරහස බව සුපැහැදිලිය. පාස්කු අභිරහස යනු ක්‍රිස්තුස් වහන්සේගේ දුක්විඳීම, මරණය, සහ උත්ථානයයි. 12 වන පියුස් පාප්වහන්සේ විසින් නිකුත් කරන ලද "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව චක්‍ර ලේඛනයට අනුව දේව වන්දනාවේ මූලිකත්වය ක්‍රිස්තුන් වහන්සේ සතුවන බව පැහැදිලි වේ. "මා සිහිකිරීම පිණිස මෙය සිදු කරන්නයි" උන්වහන්සේ මහ බ්‍රහස්පතින්දා පාස්කු භෝජනයේදී තමන් වහන්සේගේ අපෝස්තුලුවරුන්ට වදාළ සේක. ක්‍රිස්තුස් වහන්සේගෙන් ආරම්භ වූ දේව වන්දනාවේ දේව ධාර්මික පදනම මේ විශ්ව ලේඛනය මතු කරයි.

"ක්‍රිස්තුස් වහන්සේ තම පියාණන් වහන්සේට පුදන වන්දනාවද, දේව ජනතාව තම නිර්මාතෘවරයාණන් වන ක්‍රිස්තුස් වහන්සේට සහ උන්වහන්සේ මගින් පියාණන් වහන්සේට පුදන වන්දනාව" මෙයින් අදහස් කරයි (Mediator Dei, අංක 20).

මේ ඉගැන්වීම් තුළ කල්පනා කරන විට ඍජු සිංහල පරිවර්තනයක් "ජනවන්දනාව" ලෙස නිවැරදි වුවත් එයින් මතු කරන දේව ධාර්මික අභිධර්මය සමඟ ගැලපීමේදී අසම්පූර්ණත්වයක් නිරීක්ෂණය වී ඇත. "ලෙයිටුර්ජියා" යන ග්‍රීක වචනයේ ඍජු සිංහල පරිවර්තනයේ දේවධාර්මික අඩුවක් ඇති බව එබැවින් පැහැදිලි වේ. ඉහත විෂය සම්බන්ධව කටයුතු කරන බොහෝ සභා ශ්‍රේෂ්ඨයෝ "ජනවන්දනාව" යන වචනයට වඩා "දේව වන්දනාව" යන වචනය උචිත යයි ප්‍රකාශ කරන්නෝය. තවද ඉංග්‍රීසි බසින් භාවිත වන වචනය වන්නේ "Divine Worship" යන වචනයි. එමෙන්ම වතිකානයේ දේව වන්දනා පිළිබඳ අධිකාරිය හඳුන්වනු ලබන්නේ "Congregation for Divine Worship" හෙවත් දේව වන්දනාව පිළිබඳ

සංසද අධිකාරිය ලෙස යි.

දෙවන වතිකාන සමුළුවේ දේව වන්දනාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාවේ අංක 07 සහ 10 මතු කරන්නේ; ක්‍රිස්තුස් වහන්සේගේ පූජක කාර්යය සම්පූර්ණ වීමත් සමඟ, පාස්කු අභිරහස කේන්ද්‍රීය වන සැම විටම ක්‍රිස්තුස් වහන්සේගේ බලගතු වැඩ සිටීම ජනතාව කරන සියලු දේව වන්දනා පිළිවෙතකම විද්‍යමාන වන බවය. ක්‍රිස්තුස් වහන්සේගේ මහා කල්වාරි යාගයත් සමඟ දේව වන්දනාවට පූර්ණත්වයක් සහ ගැඹුරු අරුතක් එකතු විය. පුරාණ ගිවිසුමේ විවිධ යාග පූජා ඔප්පු කරමින් දේව මාලිගා වේදී එදා ජුදා ජනතාව දෙවියන් වහන්සේට වන්දනා කළත්, එම වන්දනාව පූර්ණත්වයට පත්වන්නේ ක්‍රිස්තුස් වහන්සේ කල්වාරියේ පූජා වීමත් සමඟය. ක්‍රිස්තුස් වහන්සේ ජනතාව වෙනුවෙන් කළ ජීවිත පූජාව දෙවියන් වහන්සේගේ කැමැත්ත පූර්ණලෙස ඉෂ්ට කළ බව ගෙත්සමනෙහි ජේසුස් වහන්සේ තම පියාණන් සමඟ කරන යැදුම තුළ තව දුරටත් සනාථ වේ.

"**අහෝ මාගේ පියාණනි, හැකිනම් මේ කුසලාන මා කෙරෙන් පහ කළ මැනව. එහෙත් මා කැමැති ලෙස නොව ඔබ කැමති ලෙස වේවායි යාච්ඤා කළ සේක**" (මතෙව් 26:39). දේව වන්දනාව කිතුනු ජීවිතයේ උල්පත හා උච්චතම අවස්ථාව බව දේව වන්දනාව සම්බන්ධ ව්‍යවස්ථාවේ අංක 10 පවසයි. සභාවේ සියලුම ක්‍රියාකාරකම් මෙහෙයවන දේව වරප්‍රසාද ගලා එන දිශානතියේ උල්පත දේව වන්දනාවයි. ඒ අතර දිව්‍ය පූජාව උතුම්ම ක්‍රියාවයි. ක්‍රිස්තුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ මහිමයද, ජීවත් වන ජනතාවගේ ශුද්ධත්වයද, උපරිම ඵලදායිත්වයකින් ලැබීමට දේව වන්දනාව තුළ හැකි බව ප්‍රත්‍යක්ෂ වී ඇත. ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස සෘජුවම සමරන දේව වන්දනා පිළිවෙත් දේව වන්දනා ක්‍රියා ලෙසද, අනිකුත් වන්දනා ක්‍රියා සදිසි (ඒ හා බොහෝදුරට සමාන වන - quasi liturgy), වන්දනා ක්‍රියා සහ භක්ති අභ්‍යාස ලෙස වර්ගීකරණය කෙරේ. ඒ අනුව;

I **දිව්‍ය පූජාව** (Liturgical Action)

උත්තම පූජකයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සහ උන්වහන්සේගේ ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ කාර්යයක් වන දේව වන්දනාව ශුද්ධවන්ත වන අතර සාන්ත සභාවේ වෙන කිසිම ක්‍රියාවක් ඒ හා සමාන ගෞරවයකින් සහ ඵලදායිකත්වයකින් සැලකිය නොහැකිය (ධර්ම ව්‍යවස්ථාව අංක 07). දේව වන්දනාවේ උත්කෘෂ්ට ක්‍රියාව දිව්‍ය පූජාවයි (2002 නිකුත් කරන ලද දේව වන්දනාව සහ භක්ති අභ්‍යාස නම් "දේව වන්දනා නිර්දේශය" බලන්න). දිව්‍ය පූජාව කිතුනු ජීවිතයට දේව වරප්‍රසාද ගලා එන උල්පතයි. කිතුනු ජීවිතයේ සංකේන්ද්‍රීය සාධකයයි. මනුෂ්‍යයා ශුද්ධවන්තකමට කැඳවන ප්‍රධානම මාර්ගය දිව්‍ය පූජාවයි.

II **දේව ප්‍රසාද නිධාන හෙවත් සක්‍රමේන්තු** (Liturgical Action)

කතෝලික සභාව නිල වශයෙන් ප්‍රකාශ කර ඇති සක්‍රමේන්තු හතම දේව වන්දනා ක්‍රියා වේ. ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කු අභිරහසට සක්‍රමේන්තු සියල්ලම සංකේන්ද්‍රීය වන අයුරුත්, ඒවායේ තිබෙන පිළිවෙත්, සංකේත සහ යාච්ඤා මගින් දේව ධාර්මික හරය උද්දීපනය වේ. සියලු දේව ප්‍රසාද නිධාන දානය කරන විට දිව්‍ය පූජාව පැවත්වේ.

III **යාම යැදුම** (Divine Office- Liturgical Action)

උදෑසන, දහවල්, සවස සහ රාත්‍රි යන දවසේ නිශ්චිත යාම (කාල) වලදී ගීතාවලියේ ගීතිකා ඇතුළු ශුද්ධ බයිබලයේ ඇති අත් ගීතිකා, සහ දේව වදන් ඇසුරින් දේව ජනතාව සංසයක් වශයෙන් එකතු වී දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම යාම යැදුමයි. තුන්කාල ආරාධනාව, ජපමාලය යාම යැදුමට සෘජුවම සම්බන්ධ වන්නේ ඒවායේ ඉතිහාසමය පසුබිම මතය. මෙ සියල්ල ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කු අභිරහස පරිස්මරණය (මතාසේ සිහිකිරීම) කෙරේ.

⋆ පැවිදි සදාකාලික වේදබාර ගැනීමේ පිළිවෙත සහ යාච්ඤා, අලුතින් දෙව්මැදුරක් තනා එය කැප කරන අවස්ථාව, අවමගුල් පිළිවෙත, දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවද දේව වන්දනාවට සම්බන්ධ වේ.

ලිපිය ආරම්භයේදී අප සඳහන් කළ "දේව වන්දනාව" යන වචනය ජනගත කරන්නට තුඩු දුන් හේතු, සෘජුවම දේව වන්දනාවට සම්බන්ධ වන ප්‍රමුඛ පිළිවෙත් සහ යාච්ඤා, දේව වන්දනාව වර්ගීකරණයට අයත් නොවුණත් දේව වන්දනාව නොවන වන්දනා කාරණා මේ ලිපිය තුළදී සාකච්ඡා නොවුණත් අපගේ විශ්වාසය, භක්තිය පවත්වා ගෙනයාමට හෝ ජනනය කිරීමට උපකාර කරන බව මතක් කර ගනිමු.

**සංස්කාරක පියතුමා**

## හලාවත පදවියේ සිව්වන රදගුරුතුමා වන

# අති උතුම් දේවධර්මාචාර්ය දොන් විමල් සිරි ජයසූරිය මාහිම්පාණෝ

හලාවත රදගුරු වසමේ බෝලවත්ත මීසමේ රංගම්මුල්ල ග්‍රාමයේ විසූ ජයසූරිය ආරච්චිගේ දොන් ලූකස් හා දොන් එලිසබෙත් විජේසිංහ යන යුවලගේ කනිටු පුත් විමල් සිරි දරුවා 1969 ජනවාරි 23 දා මෙලොව එළිය දිටීය. වැඩිමහල් සහෝදරයකුගේ සහ සහෝදරියකගේ බාල සොහොයුරා විමල් සිරි ය. මීසම් සහායක ගරු රිචඩ් පීරිස් පියතුමා විසින් මේ දරුවාව බව්තීස්ම කරන ලදි. නව රදගුරුතුමන්ගේ අභිෂේක මෙහෙයට සහභාගි වන්නටද වරම් ලබන රිචඩ් පියතුමා වාසනාවන්තය. විශේෂ දේව ආශීර්වාදයකි. බෝලවත්ත ගොන්සාල්වෙස් මහ විදුහලෙන් අධ්‍යාපනය ලබන ඔහු පසුව, මාරවිල සාන්ත පාවුලු දෙව්සත්හලට ඇතුළු විය.

පසුව කළුතර පලාතොට "දහම් සෙවණ" දෙව්සත්හලේද, අම්පිටිය ජාතික දෙව්සත්හලෙන් දර්ශනවාදය සහ දේවධර්මය උපාධි ලබා, 1997 අගෝස්තු 09 දා නයිනමඩමේ වික්ෂෝප දෙව්මැඳුරේදී අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු, එවකට හලාවත පදවි එඬේරාණන් විසින් විමල් සිරි සහෝදරතුමන්ට පූජකවරය දානය කරන ලදී. කටුනේරිය, තලවිල සිද්ධස්ථානය හා වෙන්නප්පුව යන මීසම්වල සහායක පියතුමකු ලෙස සේවය කර ජනහද දිනා ගත් මෙතුමා, වර්ෂ 2000 ජූලි 24 දින උසස් අධ්‍යාපනය සඳහා රෝමයට ගියේය. සාසන නීතිය පිළිබඳව ආචාර්ය උපාධිය ලබා 2005 දෙසැම්බර් මස යළි දිවයිනට පැමිණියේය. එවකට හලාවත පදවි රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිම්පාණන් විසින් පදවියේ විවාහ අධිකරණ විනිසුරු වශයෙන් වයස අවු. 35 දී එතුමන්ව පත්කරන ලදී. පසුව 2013 සිට 2019 දක්වා අම්පිටිය ජාතික දෙව්සත්හලේ ආචාර්ය මඬුල්ලට එකතු වී සහෝදරතුමන්ලාට අනගි සේවාවක් කර වසරක සබත් නිවාඩුව සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය ට ගියේය. එහිදීද කොරෝනා සමයේ පවා පදවි දෙකක විවාහ



අධිකරණ විනිසුරුවරයකු වශයෙන් සේවය කළේය.

හලාවත පදවියට රදගුරු පුරප්පාඩුවක් ඇති බව දැනගත් පියතුමා දිවයිනට පැමිණීම පමා කරමින් එහිම මීසමක ද සේවයේ රැඳී සිටියේය. එහෙත් ශුද්ධාත්මයාණන්ගෙන් සැඟවී සිටීමට එතුමාට නොහැකි විය. ඉන්පසු ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා විසින් විමල් සිරි ජයසූරිය මාහිම්පාණන් හලාවත පදවියේ සිව්වන රදගුරුතුමන් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීය.

2024 මාර්තු මස 02 වන සෙනසුරාදා, හලාවත ආසන දෙව්මැදුරේදී, අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරුතුමන්ගේ සහ අති උතුම් වතිකාන තානාපති තැන්පත් බ්‍රයන් උඩයින්වේ හිම්පාණන්ගේ ප්‍රධානත්වයෙන්, ශ්‍රී ලංකා රදගුරු මඬුල්ලේ සහභාගිත්වයෙන් අතිගරු විමල් සිරි ජයසූරිය මාහිම්පාණන්ගේ රදගුරු අභිෂේක පදවි ප්‍රාප්ති දේව වන්දනා මෙහෙය සිදුකිරීමට නියමිතය.

**සටහන ගරු ඩී. එෆ්. මැදගොඩ පියතුමා**

වර්ග කි.මී. දෙදහස් හැත්තෑ හයක විහිදෙන පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත පදවියේ නව රදගුරුතුමන් ලෙස අබිසෙස් ලබන අති උතුම් දොන් විමල් සිරි ජයසූරිය මාහිම්පාණෝ තුන්ලක්ෂ විසිපන්දාස් විසිහයක පමණ කතෝලික ජනතාවට සැබෑ එඬේරකු වෙමින්, සෙසු ආගමික ප්‍රජාවගේ අවශ්‍යතාවලටද සංවේදී වෙමින් තම රදගුරු නිලයේ ආදර්ශ පාඨය වන "උන්වහන්සේ කියන කොයි දෙයක් වුවද කරන්න" යන්න සාක්ෂාත් කරගන්නට අවැසි දේව ආසිරි, වැසි මෙන් වසීවා යැයි භක්ති ප්‍රබෝධනය සංස්කාරක පියතුමා ඇතුළු කාර්ය මණ්ඩලය, ලේඛක, සහ පාඨක සියලු දෙනාගේ ශුභාශිංසන හද බැතින් පුද කරමු. යදිමු.

# දිව්‍ය පූජාවේ දේව ධාර්මික හරය

**ප්‍රවේශය**

විශ්වාසකයන්ගේ ජීවිතයෙන් දේව වන්දනාව සහ භක්ති අභ්‍යාස ඉවත් කළොත් එහි ඇතිවන හිස්බව විශාල ය. තමන් විශ්වාස කරන දේ විශ්වාසකයා විශේෂයෙන් අත්දකින්නේ දේව වන්දනාව මගිනි. දිව්‍ය පූජාව පිළිබඳ අත්දැකීම ප්‍රධාන වශයෙන් දේව ධාර්මික වේ. එහෙත් යථාර්ථය මීට බොහෝ වෙනස් වී ඇත. වර්තමානයේ දිව්‍ය පූජාව සැදැහැවතුන් බහුතරයක් අත්දකින්නේ භක්ති ණය යුක්තියක් ලෙස මිස කතෝලික විශ්වාසයේ දේව ධාර්මික අත්තිවාරම් අත්දැකීමක් ලෙස නොවන බව සඳහන් කරන්නේ කනගාටුවෙනි. මේ නිසා ම අප දෙවන වතිකාන යුගයේ දශක ගණනාවක් පුරා සිදුවෙමින් පවතින ආත්මික සෝදාපාලුව අසීමිත ය. එබැවින් මේ කෙටි ලිපියේ අරමුණ වන්නේ දිව්‍ය පූජාව දෙස දේව ධාර්මික දෘෂ්ටි කෝණයකින් විමසිලිමත්වී විශ්වාසකයන්ගේ ජීවිතයට ඉන් සිදුවන ප්‍රායෝගික බලපෑම් කිහිපයක් සැකෙවින් ඉදිරිපත් කිරීම ය.

දිව්‍ය පූජාවේ දේව ධාර්මික හරය අවම වන තැන එහි බාහිර පිළිවෙත්මය පැතිකඩ විකෘතවීමේ අවදානම ද පවතී. පිළිවෙත තම තමන්ට රිසි සේ අනුවර්තනය කිරීම වර්තමානයේ බොහෝ සේ දක්නට ලැබේ. පිළිවෙත මානව හිතවාදී කිරීමට බොහෝ දූන උගත් අය පවා ඉදිරිපත් වන අවස්ථා එමට ය. ඉන් සිදුවන හානිය ද අපරිමිත බව බොහෝ අයට වැටහෙන්නේ නැත. ජනප්‍රිය දේ කරන්නට යාම නිසා නිවැරදි දේ යටපත්වනු දැකීම කනගාටුවට කාරණයකි. එබැවින් මේවා නිවැරදි කරන්නට අවැසි දේව ධාර්මික පදනම සාකච්ඡා විය යුතු ය.

**01 පාස්කු අභිරහසේ සංකේන්ද්‍රීය බව**

දේව වන්දනාවේ දී අප සමරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස යි. එනම්, උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය, ශ්‍රී මරණය, විජයග්‍රාහී උත්ථානය සහ අවසාන විනිශ්චය පිණිස මහිමාන්විත නැවත වැඩම කිරීම යි. (බලන්න: මීදියාතෝර් දේයි අංක 20, සක්‍රොසාන්ක්තුම් කොන්චිලියුම් අංක 7 සහ කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 1067 සහ 1068) දේව වන්දනාවේ සංකේන්ද්‍රීය සහ සුවිශුද්ධ අන්තර්ගතය මෙය යි. මෙය සනාථ කිරීම සඳහා දෙවන වතිකාන කතිකාවේ දේව වන්දනාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාව දෙස බලන්න. එහි පළමු පරිච්ඡේදය හැඳින්වීමක් වන අතර එහි දෙවන පරිච්ඡේදය දිව්‍ය සත්ප්‍රසාදය (දිව්‍ය පූජාව) පිළිබඳව යි. එහි තෙවන පරිච්ඡේදය වෙන් කර ඇත්තේ දේව ප්‍රසාද නිධාන පිළිබඳව වන අතර එහි සිව්වන පරිච්ඡේදය යාම යැදුම පිළිබඳව ය. මේ ප්‍රස්තුතයන් දේව වන්දනා ව්‍යවස්ථාව තුළ ඒ ආකාරයෙන් ප්‍රමුඛතාව ලබන්නේ ඒවා දේව වන්දනා ක්‍රියා නිසා ය. දේව වන්දනා ක්‍රියාවක් වීමට නම් අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු ලක්ෂණය වන්නේ එය ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ පාස්කු අභිරහසේ සැමරුමක් වීම ය. දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන සහ යාම යැදුම ගැනෙන්නේ ඒ දේව වන්දනා ක්‍රියා ලෙස ය. 2002 වසරේ නිකුත් කරන ලද භක්ති අභ්‍යාස සහ දේව වන්දනා ක්‍රියා පිළිබඳ නිර්දේශය ද මේ වෙනස්කම නිල වශයෙන් ම විදහා දක්වයි. ඇතැම් කතෝලික විද්වතුන් පවා මේවා අතර වෙනසක් නැති සේ කතා කළ ද ඇත්තෙන් ම දේව වන්දනා ක්‍රියා ලෙස හඳුනා ගන්නා දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන සහ යාම යැදුම නිරවුල් ලෙසින් ම දේව වන්දනා ක්‍රියා බව සහතික කිරීම සඳහා ඉහත දක්වා ඇති සභා ලේඛන වැදගත් වෙයි. තවද 2002 නිර්දේශය අනික් වන්දනා ක්‍රියා සඳහා වෙන නාමකරණයක් යෝජනා කරන්නේ එබැවිනි. උදහරණ ලෙස, දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සහ ශුද්ධ ජපමාලය සදිසි දේව වන්දනා ක්‍රියා ලෙස හැඳින්වෙන අතර ශුද්ධවූ පැය, පාදනමස්කාරය, නොවානය වැනි වන්දනා ක්‍රියා භක්ති අභ්‍යාස ලෙස සැලකේ. එබැවින් දේව වන්දනා ක්‍රියා අතර ප්‍රධාන ම දේව වන්දනා ක්‍රියාව වන දිව්‍ය පූජාව එසේ සැලකෙන්නේ එහි පාස්කු අභිරහස්මය ලක්ෂණ අන් සියලුම වන්දනා ක්‍රියාවල දක්නට ලැබෙනවාට වඩා ඉතා වැඩියෙන් සහ පැහැදිලිව දක්නට ලැබෙන බැවිනි.

අභාග්‍යයකට මෙන් කතෝලික විශ්වාසකයන් බහුතරයක් මේ දේව ධාර්මික පදනම පිළිබඳ කිසිවක් නොදන්නා බව කිව යුතුය. බොහෝ දෙනාට දිව්‍ය පූජාව යනු ණය යුක්තියකි. කිසියම් හේතුවක් මත මේ ණය යුක්තිය ඉවත් කළහොත් දිව්‍ය පූජාවට පැමිණෙන්නන්ගේ සංඛ්‍යාව දැවැන්ත ලෙස අඩුවනු ඇත. දිව්‍ය පූජාවට පැමිණෙන බොහෝ දෙනා සොයන්නේ ණය යුක්තිය ඉටු කර දිව්‍ය සත්ප්‍රසාද

වහන්සේ ලබා සැහීමකට පත්වන්නට මිස ජේසු සමිඳාණන් වහන්සේගේ පාස්කු අභිරහස අත්දකින්නට සහ එමගින් විමුක්තියේ ධර්මදූතික කාර්යයට දයකවන්නට නොවේ. ඔවුන්ට දිව්‍ය පූජාව ආගමික පිළිවෙතකි. එහි දේව ධාර්මික හරය ඔවුන්ට අදාළ නැත. ඒ නිසා පිළිවෙත තුළ කෙරෙන වෙනස්කම් දේව ධාර්මික හරයට කරන බලපෑම් පිළිබඳව ඔවුන්ට කිසිදු ප්‍රශ්නයක් ද නැත. මෙය සැබවින් ම කනගාටුදයක ය.

මෙය තවත් පියවරක් අතීතයට ගොස් විස්තර කරන්නේ නම් ඊජිප්තු දේශයේ වහල්කමින් දේව ජනතාව මුදා ගැනීමට ගිය මෝසෙස් එසේ කරන්නට පෙර අවසාන පිළිවෙත ලෙස පාස්කු බැටළුවාගේ යාගික භෝජනයට දේව ජනතාව සහභාගී කළ අන්දම සිහිපත් කළ හැකිය. ඒ යාගික භෝජනය, ඒ ගිවිසුම සහ ව්‍යවස්ථාව තවමත් ජුදා ජනතාව සිහිපත් කරන්නේ තමන් ලද ඒ විමුක්තිය පරිස්මරණය කරමිනි. ඔවුන්ට වඩා වැදගත් වන්නේ පිළිවෙත තුළ අන්තර්ගත පාස්කු විමුක්තිය අත්දකීම මිස පිළිවෙතකට සහභාගී වී ණය යුක්තියක් ඉෂ්ට කිරීම නොවේ. මෝසෙස් පුරාණ ගිවිසුමේ කළ දේ ජේසුස් වහන්සේ නව ගිවිසුමේ ඉෂ්ට කළ අතර, එහිදී යාගික වූ බැටළුවා වූයේ උන්වහන්සේම ය. මේ පාස්කු අභිරහස දිව්‍ය පූජාවේ සහ සමස්ත දේව වන්දනාවේ දේව ධාර්මික හරයයි.

**02 ගෙත්සමනියේ දී කැමැත්ත පවරා දීම**

ඉහත සඳහන් විමුක්තියේ අභිරහස සිදු කිරීමට මත්තෙන් ජේසුස් සමිඳාණන් වහන්සේ සැබෑ මනුෂ්‍යයෙකු ලෙස බලවත් පීඩාවකට ලක් වී, දණින් වැටී පියාණන් වහන්සේ අමතමින් උන්වහන්සේ කැමැති නම් ඒ දුක් පාත්‍රය තමන් කෙරෙන් ඉවත් කරන මෙන් ඉල්ලා සිටි සේක. බව්තිස්මයේ දී අහසින් නැගුණු පියාණන් වහන්සේගේ හඬ, අන්‍ය රූප විලාස වූ අවස්ථාවේ දී අහසින් නික්මුණු පියාණන් වහන්සේගේ හඬ මේ අවස්ථාවේ දී ඇසුණේ නැත. පියාණන් වහන්සේගේ මුනිවත පුත්‍රයාණන් වහන්සේගේ ජීවිත පූජාවේ අවැසිතාව තහවුරු කළා වැනිය. පුත්‍රයාණන් වහන්සේ සිය කැමැත්ත මුළුමනින් ම පවරා දුන් සේක. උන්වහන්සේ ඒ කටුක දුක් පාත්‍රය වැළඳ ගත් සේක. තමන්ගේ කැමැත්ත නොව පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට උන්වහන්සේ සපුරාම තමන්ගේ කැමැත්ත පවරා දුන් සේක. උන්වහන්සේ සෙවූයේ තමන්ගේ සතුට සැප සම්පත්තිය නොවේ. මිනිස් වර්ගයාගේ විමුක්තිය පිණිස පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරමින් උන්වහන්සේ මහිම පත් කිරීම පුත්‍රයාණන් වහන්සේගේ එකම අභිප්‍රාය විය.

දේව වන්දනාවේ පාස්කු අභිරහස සමිඳාණන් වහන්සේ ජීවත් කළේ එලෙස ය. එනම්, තමන් වහන්සේගේ කැමැත්ත මුළුමනින් ම පවරා දී තමන් වහන්සේගේ ජීවිතය පූජා කිරීමෙනි. මේ උන්වහන්සේගේ පූජක කාර්යය යි. දෙවන වතිකාන කතිකාවත දේව වන්දනාව නිර්වචනය කරන්නේ මේ ඇසුරිනි. එනම්, **දේව වන්දනාව යනු ක්‍රිස්තු සමිඳාණන් වහන්සේගේ උත්තම පූජක කාර්යය ජීවත් කිරීම ලෙසිනි** (බලන්නඃ සක්‍රොසාන්ක්තුම් කොන්චිලියුම් අංක 7).

එසේ නම් දේව වන්දනාවට තිසි අවබෝධයකින් සහභාගිවන සැදැහැවතුන්ගේ මුල්ම සහ ප්‍රධානම ආකල්පය විය යුත්තේ ද මෙය යි. **කල්වාරියට යන්නට පෙර අපි ගෙත්සමනියට යා යුතු වෙමු.** පිළිවෙතක් ලෙස දිව්‍ය පූජාවේ සිදු කරන දේ අන්තිම රාත්‍රී භෝජනයේ සහ කල්වාරියේ යාගයේ එකතුවකි. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු උන්වහන්සේ කිද්‍රොන් තැන්න හරහා ගෙත්සමනියට වැඩම කළේ මේ දුක් පාත්‍රය බාර ගැනීම පිළිබඳ අවසාන තීරණය ගැනීමට ය. දැඩි පීඩනයක් තුළ හෝ උන්වහන්සේ ප්‍රකාශ කළේ මාගේ කැමැත්ත නොව ඔබවහන්සේගේ කැමැත්ත සිදු වේවා කියා ය. එබැවින් **දිව්‍ය පූජාවට සහභාගී වන්නට යන්නට පෙර අපි සියල්ලෝම ගෙත්සමනියේ අතිදකීම ලැබිය යුතු වෙමු. එනම්, අපගේ කැමැත්ත මුළුමනින් ම පවරා දී, දෙවියන් වහන්සේ මහිම පත් කිරීම සඳහා පුත්‍රයාණන් වහන්සේ සමග යාගික වන්නට සූදනම් විය යුතු වෙමු. විමුක්තියේ උත්ථානය අත්දකින්නට අපට සැබවින් ම හැකි වන්නේ එවිට ය.**

එහෙත් සිදුවන්නේ කුමක් ද? අපි අපගේ කැමැත්ත මුළුමනින් ම පවරා දෙනවා වෙනුවට අප කැමැති දේ පිළිවෙත ඇසුරෙන් ඉෂ්ට කර ගන්නට වෙර දැරීම බහුලව සිදුවනු දක්නට ඇත. ඇතැම් විට පූජාප්‍රසාදීන් වහන්සේද තමන්ගේ හිතුමතේට, තමන්ගේ දැනුම, බලය, අත්දකීම්, හැකියා උපයෝගී කරගනිමින් නිවැරදි දේ කරනවා වෙනුවට, ජනප්‍රිය සහ තමන් නිවැරදි යයි සිතන දේ කරන්නට පෙලඹීම ඉතා බේදජනකය. පූජාප්‍රසාදීන් වහන්සේ පූජාත්වරය ලබද්දී, බිම වැතිර, සියලු සාන්තුවර ප්‍රාර්ථනාවෙන් පසුව රදගුරුතුමන් අබිමුවට ගොස් එතුමන්ගේ දෑත් අතර තම දෑත් තබා තමන්ගේ කැමැත්ත මුළුමනින් ම පවරා දෙන සේක. කිසිම පූජාප්‍රසාදීවරයකු දිව්‍ය

පූජාවේ බලධාරියෙක් නොවේ. උන්වහන්සේ, පාස්කු අභිරහස විශ්වාසවන්තව ඉෂ්ට කරන්නට ණය යුක්තියෙන් බැඳීසිටින තෝරා ගත් තේවාධරයා පමණි. දේව වන්දනා වේද සත්‍ය ව්‍යවස්ථාවේ අංක 22/3 ට අනුව දේව වන්දනාවට කිසිවක් එකතු කරන්නට හෝ අඩු කරන්නට හෝ වෙනස් කරන්නට කිසිම පූජාප්‍රසාදිවරයකුට අවසර නැත.

බොහෝ තැන්වල පිළිවෙත නිවැරදිව සිදු වුව ද, ඇතැම්විට ඇතැම් තැන්වල පැවිදි සහෝදර සහෝදරියන් ද, ඇතැම්විට ගිහියන් ද, දිව්‍ය පූජාව එහි දේව ධාර්මික බවින් ඈත්කිරීම පිළිබඳව වග කිවයුතු බව පෙනේ. ඔවුහු ද විවිධ හේතු දක්වමින් තමන් කැමැති දේ දිව්‍ය පූජාව තුළ ඉටු කරගන්නට උත්සාහ කරති. එසේ කරන සෑම අවස්ථාවක දී ම සිදු වන්නේ දිව්‍ය පූජාවේ පාස්කු හරය දියාරු වී පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු නොවීම යි. එවිට පියාණන් වහන්සේ මහිමයට පත් නොවන සේක. උදාහරණයක් ලෙස, අපගේ විවාහ දිව්‍ය පූජා ඉදිරිපත් කරමු. වර්තමානයේ විවාහ දිව්‍ය පූජා තුළ බහුතරයක් සිදුවන්නේ මනාලිය සහ මනාලයා ද, ඔවුන්ගේ දෙමාපිය නෑ හිත මිත්‍රාදීන්ගේ ද මනදෙළ පිනවීම යි. ඇතැම්විට, ගීතිකා වෙනුවට ප්‍රේම ගී ගැයීම යි. දිව්‍ය පූජාව සිදු නොකෙරෙන මිශ්‍ර විවාහ පිළිවෙත් අවස්ථාවලදී පඬුරු පෙරහැරවල් පවත්වා දේව වන්දනා නිර්දේශ අමු අමුවේ උල්ලංඝනය කිරීම යි. එසේ නොකරන්නට හේතුව අසා දැනගෙන නිවැරදි දේ කරනවාට වඩා, බොහෝ විට සිදු වන්නේ ඒ අයගේ සිත් සතුටු කිරීමට මේ දේවල් සිදු කිරීම යි. මේවා නිසා සිදු වන්නේ දිව්‍ය පූජාවේ දේව ධාර්මික හරය මුළුමනින් ම විනාශ වී යාම යි. මෑතක් වන තුරු බොහෝ තැන්වල සන්ධ්‍යා යාම යැදුම සංගීත සාජ්ජයක් බවට පත් වී තිබුණි. ගායනා කණ්ඩායම්වල ශිල්ප දක්වීම සහ උපරිමයෙන් සංගීතාස්වාදය එහි සැපයුණි. එහි තෙහිලි සජ්ඣායනය සිදු කෙරුණේ නැත. වාසනාවකට මෙන් මේ තත්ත්වය දැන් බොහෝ දුරට යහපත් අතට හැරෙමින් පවතිනු දක්නට ලැබේ. දේව වන්දනාව යනු හුදු පිළිවෙත් පැවැත්වීමක් නොවේ. එය දේව ධාර්මික යථාර්ථයකි. එය වෙනස් කරන්නට කිසිවකුට අයිතියක් නැත.

එබැවින් දිව්‍ය පූජාව සිදු කරන රදගුරුවරුන්, පූජාප්‍රසාදිවරුන් සහ ඊට සහභාගිවන ගිහි පැවිදි සැදැහැවතුන් සියල්ලට පෙර තමන්ගේ බැහැපත්කම ජීවත් කළ යුතුය. බොහෝ දේ දැන ඉගෙන ගෙන තිබීම නිසා ම සහ තමන්ගේ ම පෞද්ගලික මති මතාන්තර නිසා තමන් නිවැරදි බවත්, වසර දෙදහස් ගණන් තිස්සේ මෙම පිළිවෙත් පිළිබඳ අධිකාරිත්වය දක්වන ශුද්ධාසනයට වැරදී ඇති බවත් තීරණය කිරීම තමන්ගේ කීකරුකමේ පොරොන්දුව සහ බැහැපත්කම පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් බව කිව යුතු ය. අපි සියල්ලන් ම, සිදු කෙරෙන අභිරහසට අනුගත වනවා මිස අභිරහස සැහැල්ලු කර එය අපට අවශ්‍ය ආකාරයට සහ අපට වින්දනය දෙන මූලාශ්‍රයක් ලෙස, උඩගුවෙන් උන්මත්තක වී හැසිරවීම බරපතළ වරදකි. දේව වන්දනාව ශත වර්ෂ ගණනාවක ඉතිහාසයක් සහිත අත්දැකීමකි. එය අපගේ ජීවිත කාලය තුළ ආරම්භ වී අප සමග මිය යන දෙයක් නොවේ. එබැවින් කොතරම් දැන උගත් වුව ද අපට පෙරත් අපට පසුත් මේ දේව ධාර්මික හරය පැවතුණ සහ පවතින බව අපගේ සිහියේ රඳවා ගැනීම වැදගත් ය.

### 3 දිව්‍ය පූජාව තුළ ගිවිසුම් පසුබිම

සෑම දිව්‍ය පූජාවක් ම ගිවිසුම් අත්දැකීමකි. දිව්‍ය පූජාවේ ස්තෝත්‍ර යාගික යැදුමේ ස්තෝත්‍රයාගිකකරණයේ වදන් දෙස බලන්න. පූජාප්‍රසාදීන් වහන්සේ පූපය රැගෙන පවසන්නේ මෙය රැගෙන අනුභව කරන්න. මක්නිසාදයත්, මෙය ඔබ උදෙසා පවරා දෙනු ලබන මාගේ ශරීරය යි යනුවෙනි. මිදියුෂ කුසලානය රැගෙන පවසන්නේ, මෙය රැගෙන පානය කරන්න. මක්නිසාදයත් මෙය බොහෝ දෙනා උදෙසා වගුරුවන මාගේ ගිවිසුම් රුධිර කුසලානය යි යනුවෙනි. මෙහි දෙවන කොටසේ දී රුධිර කුසලානය සමග ගිවිසුමක් සම්බන්ධ වන්නේ ඇයි දැ යි අපි බොහෝවිට අසන්නේ නැත. බොහෝ සැදැහැවතුන්ට මෙය අදළ ද නැත. ඒ අවස්ථාවේ දී දැඩි භක්තියකින් අත්වැඳගෙන, දණ නමස්කාර කරමින්, දෝත් මුදුන් දී හිස ද නමා වන්දනා කරනවා මිස, මේ කියැවෙන වචන පිටුපස ඇති දේව ධාර්මික හරය අවබෝධ කරගන්නට අපට අවශ්‍යතාවක් දැනෙන්නේ නැතිවීම කනගාටුවකි. පාස්කු ගිවිසුම් යාගික භෝජනය යනු මනුෂ්‍යයන්ගේ පව් නිසා කඩ වූ ගිවිසුම යළි ප්‍රතිස්ථාපනය කරන ගිවිසුම් භෝජනය යි.

මෙය අවබෝධ කර ගැනීම පිණිස අපි මුලින් ම පුරාණ ගිවිසුමෙන් අනුප්‍රාණය ලබමු. උත්පත්ති පොතේ 15 වන පරිච්ඡේදයේ විශේෂයෙන් ම 9 වන වගන්තියේ සිට 18 වගන්තිය දක්වා කියවන්න. ආබ්‍රහම් ජීවත් වූ සමයේ ගිවිසුම් සිදු වූ ආකාරය මෙහි දී අපට අධ්‍යයනය කරන්නට හැකි ය. ගිවිසුමේ පාර්ශ්වකරුවන් වූයේ දෙවියන් වහන්සේ සහ ආබ්‍රහම්

ය. සාමාන්‍ය පිළිවෙත වූයේ, මරා දෙකට කපා සූදනම් කළ සත්ත්ව ශරීර කොටස් මැදින්, පාර්ශ්වකරුවන් ගමන් කළ යුතුවීම ය. එවැනි අවස්ථාවක දී ඔවුන් ගමන් කළේ රුධිරය වැගුරුණ බිමක් මත ය. ඉන් අදහස් කළේ ගිවිසුමට ඇතුළුවන පාර්ශ්වකරුවන් දෙදෙනාගෙන් කවරකු වුව ද ගිවිසුම කඩ කළහොත් ඒ තැනැත්තාට සිදු වන්නේ මේ සතුන්ට සිදු වූ ලෙස මරණයට භාජනය වන්නට බව ඒත්තු ගැන්වීම ය. එබැවින් මෙය රුධිරයේ ගිවිසුමක් විය. මෙහි දී ඉතා විශේෂ කාරණය වූයේ කපා වෙන් කරන ලද සත්ත්ව කොටස් මැදින් ගියේ දෙවියන් වහන්සේ පමණක් වීම ය. ආබ්‍රහම් ඒ වන විට තද නින්දකට පත් වී සිටියේ ය. එසේ කළේ ද දෙවියන් වහන්සේ ම ය. මනුෂ්‍යයා මෙම ගිවිසුම කඩන බව උන්වහන්සේ දැන සිටි සේක. එහෙත් මනුෂ්‍යයාව මරා ඒ ලෙයින් සැනසීමකට පත්වන්නට දෙවියන් වහන්සේ කැමති නොවන්නේ මනුෂ්‍යයා කෙරෙහි උන්වහන්සේගේ ප්‍රේමය අපරිමිත බැවිනි. අවසානයේ දී ඒ කඩ වූ ගිවිසුම සඳහා අවශ්‍ය කරන රුධිර පූජාව සිදු කරන්නේ දෙවියන් වහන්සේගේ ඒක ජනිත පුත්‍රයාණන් සහ අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කල්වාරි යාගය මගිනි. අන්තිම රාත්‍රී භෝජනයේ දී රුධිරය බවට සාරාන්තරණය (transubstantiation; change in substance) වූයේ මිදි යුෂ යි. ඒ මිදි යුෂ කුසලානය රැගෙන උන්වහන්සේ පවසන්නේ මේ ගිවිසුම් රුධිරය බව යි. ඒ අනුව කල්වාරියේ තමන් වහන්සේගේ රුධිරය මගින් කඩ වූ ගිවිසුම යළි ප්‍රතිස්ථාපනය කරන්නට හැකි වූයේ උන්වහන්සේට ය. අප අවබෝධ කර ගත යුත්තේ දිව්‍ය පූජාව රුධිරයේ ගිවිසුම යළි ප්‍රතිස්ථාපනය කළ යාගික භෝජනය බව ය. එමගින් ඊට සහභාගිවන සියල්ලෝ ප්‍රතිස්ථාපනය කරන ලද ගිවිසුමේ කොටස්කරුවෝ වන්නෝ ය. එසේ ගිවිසුමේ කොටස්කරුවන්-නොවී- යාගික භෝජනය වැළඳීම සුදුසු නැත. මෙය අප අතුරින් කී දෙනකුට වැටහෙනවාද යන්න ප්‍රශ්නයකි.

ධර්මිෂ්ඨ ජීවිත ගත කරන ඇතැම් කතෝලිකයෝ දිව්‍ය පූජාවට සහභාගිවීම ප්‍රතික්ෂේප කරති. ඔවුන් පවසන්නේ පල්ලි නොගිය ද, කිසිම පණතක් කඩ නොකරමින් ඔවුන් ගත කරන ජීවිතය, නිතර පල්ලි යමින් පණත් කඩ කරන කතෝලිකයන්ගේ ජීවිතවලට ද ආදර්ශයක් බව යි. එහෙත් ඔවුන්ට නොතේරෙන්නේ දිව්‍ය පූජාවට සහභාගි නොවී අලුත් කරන ගිවිසුමට සම්බන්ධවීමට සහ ගිවිසුම් යාගික භෝජනයට සහභාගි වන්නට ඔවුන්ට නොහැකි බව යි.

**4 දිව්‍ය පූජාවේ දේව වාක්‍ය ප්‍රකාශනයේ අවශ්‍යතාව**

සැම දිව්‍ය පූජාවකදීම, දේව ප්‍රසාද නිධානයකදීම සහ යාම යැදුමේ දී අනිවාර්යයෙන් ම දේව වාක්‍ය ප්‍රකාශනය සිදු කෙරේ. බොහෝ කතෝලිකයන් මෙයට සාවධානව සවන් දී ඉන් විපුල ආත්මික ඵල ප්‍රයෝජන උකහා ගන්නා බව අපි දනිමු. එහෙත් එසේ නොකරන්නෝ සහ එහි වැදගත්කම පිළිබඳ කිසිදු අවබෝධයක් රහිතව හැකි උපරිමයෙන් දේව වාක්‍ය පිළිවෙත මග හරින්නෝ ද අප අතර බොහෝ සිටිති. ඇතැම් අය දිව්‍ය පූජාවට පැමිණෙන්නේ දේව වාක්‍ය පිළිවෙත මග හරිමිනි. මෙය විශේෂයෙන් විවාහ දිව්‍ය පූජාවල සුලභ ය. පිළිවෙතේ මුල් කොටස අවසන් වීමෙන් පසු පැමිණ ස්තෝත්‍රයාගිකකරණයට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම ප්‍රමාණවත් බව ඔවුහු සිතති. එබැවින් සැකෙවින් වුවද මෙහි දේව ධාර්මික සන්දර්භය සඳහන් කළ යුතු ය.

දේව වාක්‍ය පිළිවෙත දිව්‍ය පූජාවේ කොටසක් වන්නේ ජුදා පාස්කු භෝජනයේ දී සිදු කෙරෙන පාස්කු **හග්ගඩාවට** සමාන්තරව ය. එද මෙන් අදත් ජුදා ජනතාව තමන්ගේ වාර්ෂික පාස්කු උත්සවය සමරන්නේ පාස්කු බැටළුවාගේ භෝජනය සමග ය. එය මනා සූදනමකින් යුතුව සහ සම්ප්‍රදයට අතිශය විශ්වාසවන්තව සිදු කෙරේ. භෝජනය අනුභව කිරීමට පෙර සියල්ලන් මේසය වටා අසුන් ගෙන මුලින් ම කරන්නේ **පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ සිදු කළ අරුම පුදුම ක්‍රියාන්විතයන් යළි පරිස්මරණය කිරීම යි. එය හුදු සිහි කැඳවීමක් නොවේ. එය යළිත් ඒ විමුක්තිදායක අතීතය ජීවත් කිරීමේ මොහොත යි.** ඒ අනුව **මෝසෙස් ඊජිප්තු දේශයෙන් තම ජනතාව මුදාගෙන පැමිණීමේ දීර්ඝ කතාව හෙවත් පාස්කු හග්ගඩාව** නිවසේ වැඩිමහල් පිරිමියෙක් කියන්නට පටන් ගනී. සියල්ලෝ මේ කතාව බොහෝ වාරයක් මින් පෙර අසා තිබුණ ද සාවධානව යළි ඒ කතාවට සවන් දෙති. ඒ කතාව ඇසීම ගිවිසුම් භෝජනයේ කොටසකි. ඒ කතාව පරම්පරාවෙන් පරම්පරාවට දයාද කිරීම ඔවුන්ගේ පරම යුතුකමකි. ඒ කතාව ඉතා දිග වුවත් ඉන් කිසිවක් අඩු කරන්නේ නැත. සම්පූර්ණ කතාවට සියල්ලන් සහභාගි වන්නේ දෙවියන් වහන්සේට තමන්ගේ කෘතඥතාව පුද කරමිනි. එමෙන් ම පාස්කු මංගල්‍යයෙන් පසුව සැම සබත් දිනයකදී ම මෙම හග්ගඩාව කොටස් වශයෙන් සිනගෝගයේ දී ප්‍රකාශ කෙරේ ඊට සහභාගි වීමද අනිවාර්ය වේ.

ජුදා ජනතාවගේ පාස්කුවේ පූර්ණත්වය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ අත්දකින්නේ ක්‍රිස්තු

භක්තිකයෝ ය. අපගේ පාස්කු මංගල්‍යයේ ඉතා වැදගත් ම අවස්ථාව ආලේලූයා සෙනසුරාද රාත්‍රියේ දී සිදු කෙරෙන විට ඉතා දීර්ඝ දේව වාක්‍ය කොටස් ප්‍රකාශ කෙරෙන්නේ ජුද හග්ගඩාවට සමාන්තරව ය. එබැවින් ඒ දේව වාක්‍ය කොටස් කප්පාදු කිරීම ඉතා ශෝචනීය ය. ඒ සම්පූර්ණ කතාවට සහභාගිවීමේ ශුද්ධ අයිතිය දේව ජනතාව සතු ය. අපගේ මීසම් බොහෝමයක ආලේලූයා සෙනසුරාද රාත්‍රිය බලධරයන්ගේ කප්පාදු රාත්‍රිය බවට පත්ව තිබීම අතිශයින් කනගාටුදයක ය.

මේ හග්ගඩාව සැම ඉරුදිනකම සහ සතියේ දිනවල කොටස් වශයෙන් යළි ප්‍රකාශයට පත් කෙරේ. එය ද ගිවිසුම් පිළිවෙතේ කොටසකි. හග්ගඩාවට සවන් නොදී යාගික භෝජනයට සහභාගිවීමට කිසිවකුට අයිතියක් නැත. එහෙත් බොහෝවිට සිදුවන්නේ හග්ගඩාව මගහැරීම ය. ඇතැම් තැන්වල දෙවන දේව වාක්‍ය ප්‍රකාශනය අත් හරිනු දක්නට ලැබේ. ඇතැම් තැන්වල පිළිතුරු ගීයේ පද කප්පාදු කරන්නට ද පටන් ගෙන ඇති අතර දිව්‍ය පූජාව දිග බැවින් එය කෙටි වන නිසා මෙවැනි දේ කරන බලධරයෝ ඉතා ජනප්‍රිය වෙති. එහෙත් මෙය බරපතළ වරදක් වන්නේ දිව්‍ය පූජාවේ දේව ධාර්මික සංදර්භයට ඉන් බරපතළ හානියක් වන බැවිනි.

නික්මයාම පොතේ 24 පරිච්ඡේදයේ 3 සිට 8 වගන්ති කියවන්න. දේව ජනතාව ගිවිසුමට බද්ධ කිරීම සඳහා මෝසෙස් කුමක් කළේ ද යන වග ඉන් පැහැදිළි කෙරේ. මෝසෙස් ගිවිසුම මුළුමනින් ම දේව ජනතාව වෙත කියවා ප්‍රසිද්ධ කරයි. දේව ජනතාව ඒ ගිවිසුම් කොන්දේසි බාර ගෙන ඒ සියල්ලට අවනතවීමට පොරොන්දු වෙති. පූජාසනය වෙත රුධිරය කොටසක් ඉසීමෙන් පසුව සිදු කෙරෙන මේ ගිවිසුම් ප්‍රකාශනයෙන් අනතුරුව ඉතිරි රුධිර කොටස මෝසෙස් ජනතාව මත ඉසියි. ගිවිසුමේ රුධිරය පිළිබඳ අපගේ අවබෝධය මේ ඇසුරින් තව දුරටත් තහවුරු කෙරේ. එහෙත් රුධිරය ඉසින්නට පෙර ගිවිසුම ප්‍රකාශ කිරීම අතිශය වැදගත් බව අපට මෙයින් පැහැදිලි වෙයි.

දිව්‍ය පූජාවට පැමිණෙන සියල්ලන්ට දේව වාක්‍ය ඇසුරින් මේ ගිවිසුම ප්‍රකාශයට පත් කෙරේ. දේව වාක්‍යය එසේය යයි කීමෙන් පසුව දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා යි අප ප්‍රසිද්ධියේ පවසන්නේ එදා පුරාණ ගිවිසුමේ ජනතාව ගිවිසුම් කොන්දේසි සියල්ල පිළිගෙන ඒවා පිළිපදින්නට එකග වු ආකාරයට ය. ගිවිසුම් රුධිරය ලබන්නට අප සුදුසුකම් ලබන්නේ ඉන් පසුව ය.

එබැවින් දේව වාක්‍ය ප්‍රකාශනය අනිවාර්යයෙන් සහ අර්ථවත්ව සිදු විය යුතුම ය. දේව වාක්‍ය ප්‍රකාශ කරන්නන් විශේෂයෙන් ඒ සඳහා පුහුණු කර පත් කළ යුතුය. කුඩා ළමයින් දේව වාක්‍ය ප්‍රකාශනය සඳහා යොදු ගැනීම නතර කළ යුතු වන්නේ මෙය වැඩිහිටි දිවැසිවර වගකීමක් නිසා ය. එමෙන් ම දේව වාක්‍ය කප්පාදුව බරපතළ වරදක් බව සහ ඒ සඳහා කිසිම කෙනකුට කිසිම අවසරයක් නැති බව ද වටහා ගත යුතුය. ජනප්‍රියවීම සඳහා සහ දිව්‍ය පූජාව පැයක් ඇතුළත නිම කිරීම සඳහා එසේ කරන්නන් දේව ජනතාවට කරන්නේ බරපතළ වරදකි.

**5 යාගික භෝජනයේ දේව ධර්මය**

නික්මයාම පොතේ 12 වන පරිච්ඡේදයේ සඳහන් පාස්කු බැටළු යාගික භෝජනය මෙහි ලා පාදක වන අත්දැකීම යි. දෙවියන් වහන්සේ මෝසෙස්ට සහ ආරොන්ට විස්තර කර දෙන්නේ මේ බැටළු යාගික භෝජනය මුල් වතාවට සිදු කරන ආකාරය සහ ඉන් මත්තට යුගාන්තය දක්වාම එය පරිස්මරණයේ අත්දැකීමක් කර ගන්නා ආකාරය යි. සැම පවුලක් ම මේ බැටළුවා පූජා කළ යුතු විය. එමෙන් ම ඒ බැටළුවා අඩුපාඩු විරහිත, අවුරුද්දක් වයසැති පිරිමි බැටළුවකු විය යුතු ය. යාග කෙරෙන මේ බැටළුවාගේ රුධිරය සැම නිවසකට ම ඇතුළු වන දොරේ තැවරීමෙන් පැමිණෙන්නට නියමිතව තිබුණු මාරාන්තික දණ්ඩනයෙන් දේව ජනතාව මුදා ගනු ලැබිණි. මරණයේ දූතයා මේ බැටළු රුධිරය තවරන ලද නිවෙස් මග හැරියේ ය. එබැවින් මෙම බැටළුවාගේ මරණය දේව ජනතාවගේ ගැලවීමට හේතු විය. එමෙන් ම ඒ බැටළු මාංස අනුභව කරන්නට ද දෙවියන් වහන්සේ ඔවුන්ට අණ කළ සේක. කිසිවක් ඉතිරි නොවන අන්දමින් අනුභව කරන්නට උන්වහන්සේ ඔවුන්ට නිර්දේශ කළ සේක. එබැවින් මෙය යාගික භෝජනයක් විය. තමන්ගේ නික්මයාම සනිටුහන් කරන සහ වහල්බවේ අන්ධකාරය නිම කළ යාගික භෝජනය එය විය. එය සිදු කරන්නට එතරම් පහසු වූයේ ද නැත. දශක ගණනාවක් ජීවත් වූ නිවෙස් සහ රට අතහැර යාම එතරම් කඩිකමින් කළ හැකි දෙයක් නොවේ. බොහෝ දේ සංවිධානය කළ යුතුව තිබුණි. බොහෝ දේ අසුරා ගෙන යන්නට ගමන් මලු සූදනම් කළ යුතුව තිබුණි. ගමනට අවැසි ආහාරපාන හැකි තරම් ගෙන යන්නට සූදනම් කර ගත යුතු විය. එහෙත් බොහෝ අයට ඒ බොහෝ දේ කරන්නට නොහැකි විය. බොහෝ දේ පරිත්‍යාග

කරමින් බැටළු යාගයේ ම කොටසක් වන්නට සිදු විය. මේ සියල්ල කළේ කාටවත් ප්‍රදර්ශනය කරන්නට නොවේ. දෙවියන් වහන්සේගේ අරුම පුදුම ක්‍රියා වෙනුවෙන් උන්වහන්සේ මහිම පත් කිරීමට ය.

දිව්‍ය පූජාවේ පඬුරු පෙරහැරෙන් ආරම්භ වන ස්තෝත්‍ර යාගික පිළිවෙත යාගිකබව පාදක කර ගත් අත්දැකීමකි. පුරාණයේ පාස්කු බැටළුවා මෙන් දූන් පූජා වන්නේ දේව බැටළු පෝතකයාණන් වන ජේසුස් සමිඳාණන් වහන්සේ ය. උන්වහන්සේගේ රුධිරයෙන් අපි දූන් ගැලවීම ලබමු. ඒ යාගය නිසා විමුක්තිය ලබමින් යාගික බැටළුවාණන්ගේ ශරීරය වළඳමු. මෙය ප්‍රදර්ශනයක් හෝ එකිනෙකාව පසසා ගන්නා අවස්ථාවක් හෝ නොවේ. පඬුරු පෙරහැරේදී අද බොහෝවිට සිදුවන්නේ යාගික භෝජනයකට සූදානමක් නොවේ. එය සිත් සතුටු කරන අවස්ථාවක් බවට පත්ව තිබේ. එහි දී ගැයෙන ගීතිකා යයි කියැවෙන ඇතැම් ප්‍රබන්ධ මේ දේව ධාර්මික යථාර්ථයෙන් සැදැහැවතුන් බොහෝ ඈත් කරන්නට මිස ළං කරන්නට සමත් වන්නේ නැති බව සුපැහැදිලි ය. ඒවායේ බොහෝවිට වර්ණනා කෙරෙන්නේ අප දූන් පඬුරුවල අරුමය යි. අපේ දහඩිය සහ කඳුළු කතන්දර යි. අපේ දෙමාපියන්, අපේ රට, අපේ දූය යනාදිය පිදීමේ අරුමය යි. ප්‍රධාන පඬුරු වන්නේ ජේසුස් සමිඳාණන් වහන්සේගේ ශ්‍රී ශරීරය සහ රුධිරය බව දූන් බොහෝවිට සඳහන් වන්නේවත් නැත. එපමණක් ද නොවේ. බොහෝවිට පඬුරු පුදන්නට එන අයගේ පඬුර ගනිද්දී ඔවුන්ගේ හිස මත අත් තබා පඬුරු වෙනුවෙන් කිසියම් ආශීර්වාදයක් දනය කිරීම ද මෑතක සිට දක්නට ලැබේ. මෙය ඉතා ජනප්‍රිය වී ඇත. එබැවින් පඬුරු පුදන්නට එන බොහෝ අය පඬුරට පෙර දෙන්නේ හිස ය. එක් පඬුරක් සමග ළමයින් දෙතුන් දෙනකු ගෙනැවිත් ඔවුන්ගේ හිස මත පූජාප්‍රසාදීතුමන්ගේ අත් තබා ගැනීම ඔවුන්ට එක්තරා විශේෂ අත්දැකීමකි. නැතිබැරිකම නිසා හෝ වෙනයම් සාධාරණ හේතුවක් නිසා හෝ පඬුරක් ගෙන එන්නට නොහැකි අයට මේ ආශීර්වාදය නැත. ඇත්තෙන් ම මෙය විකෘතියකි. දේව වන්දනා පිළිවෙත්වල මේ පිළිබඳ කිසිදු නිර්දේශයක් නැත. මේ අප විසින් හඳුන්වා දෙන ජනප්‍රිය දේවල් ය. මේ මගින් සිදුවනුයේ ඒ පිළිවෙත්වල තිබිය යුතු දේව ධාර්මික ලක්ෂණ විකෘතවීම යි. මේවා පිළිබඳ කිසිදු විග්‍රහයක් කෙරෙන බවක් පෙනෙන්නට ද නැත. ප්‍රතිඵලය වී ඇත්තේ දිව්‍ය පූජාවේ දේව ධාර්මික ගති ලක්ෂණ අවම වී එය හුදු සමාජමය ජනහිතකාමී පිළිවෙතක් ලෙස ඉතිරිවීම පමණි.

**6 සමාප්ත සටහන**

මේ ආකාරයෙන් සාකච්ඡා කළ හැකි දේ තව බොහෝ ඇත. දේව ජනතාව දිව්‍ය පූජාවට පැමිණෙන විට ඔවුන්ව සැලකෙන්නේ ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය ලෙස ය. රාජකීය පූජක සෙනගක් ලෙස ය (නික්මයාම 19 6 සහ 1 පේදුරු 2 4-9 බලන්න). මෙවැනි දේව ධාර්මික පදනම් නිසා දිව්‍ය පූජාවේ බොහෝ විශේෂ සංවාද ඇතුළු කර තිබේ. උදහරණයක් ලෙස, දිව්‍ය පූජාව ආරම්භයේ දී සිදු කරන ආචාරය එතරම් ගම්භීර සහ සාමාන්‍ය ව්‍යවහාරයෙන් ඈත්වූ, ශුද්ධ ලියැවිල්ලෙන් ම උපුටා ගත් කොටසක් ලෙස දක්වා ඇත්තේ මේ බව සනාථ කිරීම සඳහා ය. එහෙත් මේ පිළිබඳ අවබෝධයකින් තොරව බොහෝ තැන්වල මේවා සිතු සිතු ලෙස ජනහිතකාමී කරනු පෙනෙන්නට ඇත.

දිව්‍ය පූජාව නිමා කෙරෙන්නේ දූවැන්ත ධර්මදූත කාර්යයක් සැදැහැවතුන් වෙත බාර කරමිනි. එහෙත් මේ දේව ධාර්මික හරය ඉතා දුර්වල තත්ත්වයකින් පිළිවෙතේ යටපත් කරනු දක්නට ලැබීම කනගාටුදයක ය. අන්තිම රාත්‍රී භෝජනයෙන් පසුව සමිඳාණන් වහන්සේ විවේක ගන්නට නොගිය සේක. උන්වහන්සේ ගියේ ගෙත්සමනියට ය. එහි දී තමන්ගේ කැමැත්ත මුළුමනින්ම පියාණන් වහන්සේට පවරා දී මහා කල්වාරි ජීවිත යාගය පුද කරන්නට ය. මෙවැනි දේ අපගේ දිව්‍ය පූජාවේ පිළිවෙත් සමාප්තිය සනිටුහන් කළ යුතු අතර සැදැහැවතුන්ව ශුද්ධාත්මාගමනයෙන් පසු ඉමහත් ප්‍රබෝධයෙන් සුබාරංචිය දේශනා කරන්නට උත්සුක වූ පේදුරු සහ අනිකුත් අපෝස්තුලුවරුන්ගේ තත්ත්වයට පත් කළ යුතු ය.

දේව වන්දනාව සැබවින් ම සහ අතිශයින් ම දේව ධාර්මික ය. එහි ඇත්තේ සමාජවාදයක පදනමක් හෝ වින්දනය දනවන ජනහිතකාමීත්වයක් නොවේ. දේව වන්දනාවේ නිසි ආත්මික ඵල බිහිවන්නේ එම දේව ධාර්මික බව අත්දකින්නට පටන් ගන්නා මොහොතේ සිට ය. මේ දේව ධාර්මික බව පසෙක ලා අපගේ වින්දනය සහ පහසුව උදෙසා ද, අපගේ පණ්ඩිතකම්

19 වන පිටුවට.....

**ගරු සිසිල් ජෝයි පෙරේරා පියතුමා.**
කළුතර, "දහම් සෙවණ" දෙව්සත්හල.

# රහසේ පියමනිනා - සුදු පවුලේ පැවිදි සොහොයුරියෝ



සිය ජීවිතය දෙවිඳුන් වෙත පුදා සේවයට කැපවෙමින්, එකී සේවය අන් අය වෙනුවෙන් ඉටුකර, මීසමකින් සමුගන්නා පියතුමන්ලාට බොහෝ හරසර, තෑගිබෝග පුද කිරීම අපට සුලබවම දකින්නට ලැබේ. මා ලත් අත්දැකීම් අනුව, ඇතැම් විට, පමණ ඉක්මවා කෙරෙන ගුණ ගැයුම් - තෑගි දීම් අවශ්‍යමද? යන්න කිතුනුවකු ලෙස මා කල්පනා කර ඇති අවස්ථාද තිබේ. මෙවන් පරිසරයක් තුළ බම්බලපිටිය ශුද්ධවූ පවුලේ කන්‍යා සොහොයුරියන්ගේ විදුහල්පති සේවා මාරුවීම්වල දී ලත් අත්දැකීම් කිතුනුවකු ලෙස මා ජ්වලිත කළ හෙයින්, එකී නිකායේ පැවිදි සොහොයුරියන් හට මෙන් ම මා පෞද්ගලිකව ම නොදන්නවා මුත්, බොහෝ නිකායවල පැවිදි සොහොයුරියන් හට ද උපහාරයක් ලෙස මෙලෙස සටහන් කළ යුතු යැයි සිතුවෙමි.

බම්බලපිටිය ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ ගෙවුණු වසර කීපය තුළ පාසලේ විදුහල්පති සේවා මාරුවීම් කිහිපයක් ම සිදුවිය. ඉන් ඇතැම් මාරුවීම් සිදුවූයේ පාසල් නිවාඩු සමයේ ය. නැවත දරුවන් පාසලට ආ විටය, අප දන්නේ විදුහල්පති සිස්ටර් මාරු වී ඇති බව. පුදුමයකි! එතුමියගේ සේවය අගයමින් අඩු තරමින් පීරියඩ් එකක කාලයක් වත් ඒ වෙනුවෙන් පාසලේ දී වැය වන්නේ නැත. කිසිදු තෑගි බෝග දීමක් සිදුවන්නේ ද නැත. දෙමාපියන් ට බල කරමින් මුදල් එකතු කිරීම් ද නැත. මේ තත්ත්වය තවත් ඉදිරියටත් ගෙන යමින් වර්තමාන විදුහල්පතිනිය ගෙවුණු ගුරු දිනයේ දී දරුවන් ට දැන්වූයේ කිසිදු දරුවකු පෞද්ගලිකව ගුරුතුමියන් වෙත තෑගි බෝග ගෙන නො ආ යුතු බවයි. මේ සියල්ල දෙස බලන විට සිය සේවය නොමසුරුව පුදමින් දැයේ දූවරුන්ගේ අනාගතය වෙනුවෙන් අමිල මෙහෙවරක් ඉටුකර අවසානයේ රහසේ නිහඬව ම පාසලෙන් සමු ගන්නා ගරු විදුහල්පති පැවිදි සොහොයුරියෝ පිළිබඳව මා හට හැකි අයුරින් ජනතාව දැනුම්වත් කළයුතු යැයි මා සිතනුයේ, මා ද වෙන්නප්පුව ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ උගත් සිසුවියක ලෙස නිහතමානි හැඟීමෙනි.

සරල චාම් එහෙත් දෙවිඳුන් වෙත යොමු වූ බැතියෙන් සැම විට ම පිරිපුන් මේ පැවිදි සොහොයුරියන් සිය දියණිවරුන් ද, ඒ මඟ ගැනීමට අපමණ වෙහෙසක් දරන බව නොකියාම බැරිය. සැබවින් ම දෙමාපියන් ලෙස අප ද ඒ ගැන අවදි විය යුතුය. වර්තමාන සමාජ රැල්ල ට හසු වී අයාලේ ගසාගෙන ගොස් දිවි අතරමං කර ගන්නා දියණියක නොවී, දෙවිඳුන් වෙත බැතියෙන් යුත් සරල චාම් එහෙත් යහපත් දියණියක සමාජයට දායක කරවීම මහත් අභියෝගයක්ව පවතින අද සමාජයේ අපි, අපගේ දරුවන් වෙනුවෙනුත් අපගේ දරුවන් වෙනුවෙන් වෙහෙසෙන සිස්ටර් ප්‍රින්සිපල් ඇතුළු පැවිදි සොහොයුරියන් වෙනුවෙනුත් වඩ වඩාත් දෙවිඳුන් යදිමු.

නීතිඥ නවීනා වර්ණකුල

# දේව ප්‍රසාද නිධාන හා බැඳී පවතින කිතුනු පැවැත්ම

හැඳින්වීම

දේව ප්‍රසාද නිධාන සම්බන්ධව කතිකා කිරීමේ දී සාන්ත තෝමස් ඇක්වයිනාස් මුනිතුමා ඉදිරිපත් කොට ඇති වර්ගීකරණය දෙස මූලිකව අවධානය යොමු කිරීම වැදගත්ය.

අ) මූලාරම්භක දේව ප්‍රසාද නිධාන (ප්‍රවිෂ්ට වීමේ සක්‍රමේන්තු)

- බව්තීස්මය
- අභිවෘද්ධි ආලේපය
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

ආ) සේවයේ (සමාජීය) දේව ප්‍රසාද නිධාන

- (නිල) පූජකවරය
- ආශීර්වාදකාර බන්ධනය

ඇ) සුවදානයේ දේව ප්‍රසාද නිධාන

- රෝගීන් ආලේප කිරීම
- සමඟි සන්ධානය

තවද, මෙම වර්ගීකරණය මත පදනම් වූ දේව ප්‍රසාද නිධාන යුගල ද ඉස්මතු වෙයි.

1. බව්තීස්මය සහ අභිවෘද්ධි ආලේපය
2. රෝගීන් ආලේප කිරීම සහ සමඟි සන්ධානය

මේ ලිපියේ අරමුණ වනුයේ ශුද්ධ වූ ආලේපන (විශේෂයෙන් ක්‍රිස්මා ආලේපනය, Sancta Chrisma, SC) හා සම්බන්ධ දේව ප්‍රසාද නිධාන ඉතා ප්‍රායෝගිකව අවබෝධ කර දීම බව සැල කිරීම වැදගත්ය.

**බව්තීස්මය සහ අභිවෘද්ධි ආලේපය**

නව ජීවිත පැවැත්මක ආරම්භය ප්‍රසාද ස්නාපනයෙන් උදාවෙන බව අපි දනිමු. මෙය විශ්වාසයේ ජීවිතයකි. තවද මෙය කිතුනු දිවියේ මූලිකම අඩිතාලම ලෙස සැලකිය හැකිය. (කතෝලික සභා ධර්මෝපදේශය 1213-1274)

"එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ශ්‍රාවකයන් කරන්න. පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම ස්නාපනය කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න" (මතෙව් 28,19-20).

මෙම උපත අරබයා ගැලවීම දායාද කර ගැනීමට මාවත සැලසෙයි. "ගිල්වීම" හෝ "හිස මත ජලය වත් කිරීම" මඟින් මේ සක්‍රමේන්තුව ප්‍රදානය කරනු ලබයි. (පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන්..)

තවද මේ ප්‍රසාද නිධානයේ ඵලය ලෙස සලකනු ලබනුයේ ජන්ම පාපයෙන් නිදහස් වීම මගින් අපට දායාද වන ක්ෂමාවයි. එමෙන්ම දේවපුත්‍ර භාවය උරුම වීම සහ මෙමඟින් ශුද්ධාත්ම මන්දිරයක් බවට පත්වන බවද කතෝලික සභා ධර්මෝපදේශය අපට උගන්වයි.

තවද ක්‍රිස්තු දේහයට සංයුක්ත වීමද මෙමඟින් සිදුවන බව අපට පෙන්වා දෙයි. (ක.ස.ධ. 1267) මේ සම්බන්ධව තවදුරටත් කතා කිරීමේ දී කිතු සමිඳාණන්ගේ පූජකත්වයට හවුල් වීමක් ද සිදුවන බව ඉස්මතු වෙයි.

ඈත අතීතයේ පටන්ම කුඩා ළමයින්ව බව්තීස්මය කරන ලද්දේ එමඟින් ඔවුන් දේව වරප්‍රසාදවලට නතුවන නිසාය. ළදරුවන් බව්තීස්මය කරන ලද්දේ සංඝයේ ඇදහිල්ල මතවීම විශේෂත්වයකි. ප්‍රසාද ස්නාපනය නොලබා (ජලයෙන්) මිය යන ළමයින් වෙනුවෙන් යාච්ඤා කිරීමෙන් ඔවුන්ව දේව කරුණාවට නතුකරලීමද විශ්වාසයේ සංඝයේ වගකීමකි. හදිසි අත්‍යවශ්‍ය අවස්ථාවකදී, ඕනෑම කෙනකුට, ප්‍රසාද ස්නාපනය නොලැබූ කෙනෙකුට වුවද (ක.ස.ධ. 1256) ශුද්ධ වූ ත්‍රිත්වයේ නාමයෙන් බව්තීස්ම කළ හැකිය. ජලයේ බව්තීස්මයට නතු නොවුවද ස්වාමීන් වහන්සේ තුළ ඇති විශ්වාසය අරබයා මරණයට පත්වන සියල්ලන් හට ගැලවීම අයිති වන බවද සාන්ත සභා මාතාව තව දුරටත්

අපිට උගන්වන්නීය (රුධිරයේ සහ ආශාවේ බව්තීස්මය ලෙස මෙය හඳුන්වමු, ක.ස.ධ. 1258).

මේ ලිපියේ මූලික අවධානය යොමු වනුයේ ක්‍රිස්මා ආලේපනය හා බැඳී පවතින "නොමැකෙන සලකුණ/චරිතාංගය" වෙත බව අවබෝධ කරගනිමු. එනිසා මේ සක්‍රමේන්තුව දානය කරනු ලබනුයේ ජීවිතයේ එක් වතාවක් පමණි (ක.ස.ධ. 1272).

බව්තීස්ම පිළිවෙත මෙලෙස විස්තර කරයි. (Rite)

"ගැලවීමේ තෛලයෙන් ඔබ ආලේප කරන සේක. පූජාප්‍රසාදිවරයකු, දිවැසිවරයකු සහ රජකෙනකු (එඬේරකු) වශයෙන් ක්‍රිස්තුස් වහන්සේ ආලේප කරනු ලැබුවාක් මෙන් ඔබද, උන්වහන්සේගේ ශරීරය වන ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් මෙන්ද සදාතන ජීවිතයෙහි හවුල්කරුවන් මෙන්, සැම විටම ජීවත් වෙත්වා".

මේ ත්‍රිවිධ කාර්යය හා සම්බන්ධව ක්‍රිස්තුස් වහන්සේගේ දූත කාර්යයට මෙලෙස අපව සෘජු ලෙස බද්ධ කරනුයේ එදිනෙදා ජීවිත ගමනේදී උන්වහන්සේට සාක්ෂි දැරීම සඳහාය. පිළිවෙත තුළ ජලයේ බව්තීස්මයට අනතුරුව දරුවාගේ හිස මුදුනට ක්‍රිස්මා ආලේපය දෙයි. එමෙන්ම හදවතේ නොමැකෙන ලාංඡනයක් පැල පදියම් වෙයි. සැබවින්ම මෙය දූත කාර්යය සඳහා යොමු කිරීමකි. මේ දූත කාර්යයට ප්‍රබල ලෙස සාක්ෂි දැරීම සඳහා අභිවෘද්ධි ආලේපය නමැති සක්‍රමේන්තුව මඟින් වඩ වඩා තිරසාර කරයි. එමෙන්ම ප්‍රසාද ස්නාපනය සහ අභිවෘද්ධි ආලේපය අතර ඇති සමීප සම්බන්ධතාව ඉස්මතු වෙයි. රදගුරුතුමා විසින් අපේක්ෂකයාගේ නළල ක්‍රිස්මා ආලේපනයෙන් ආලේප කිරීමෙන් ප්‍රසාද ස්නාපනීය කැඳවීම තවදුරටත් තහවුරු කරයි.

ශුද්ධ වූ පාවුලු තුමන් මේ අනන්‍යතාවය මෙලෙස විස්තර කරයි. "බව්තීස්ම ස්නාපනය ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ සමග ඒකාබද්ධ වූ අපි සියල්ලෝ ඒ බව්තීස්ම ස්නාපනයට සම්බන්ධ වී උන්වහන්සේ සමඟ වළලනු ලැබුවෙමු. ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ සේම, අප ද නව ජීවිත මඟක ගමන් කරනු සඳහා..." (රෝම 6/3-4).

කොතෙක් දුරට මේ සත්‍යතාව කිතුනු අපට අවබෝධ වී ඇත්දැයි විවෘත ප්‍රශ්නයකි. බොහෝ විට අවශ්‍ය දේ ඉවතලා, බාහිර දේ අඳුරේ අතපත ගා සොයා ගැනීමට තැත් කරන ක්‍රමවේදයට බොහෝ විට අප පුරුදු වී සිටීම කනගාටුදායකය.

ඉරුදින දිව්‍ය පූජා යාගයට නොවරදවාම සහභාගී වීමට යොමුවන සියලු භක්ති අභ්‍යාස හා ඇලී ගැලී සම්බන්ධ වෙමින්, එක්වරු ශීලය රකින්නට (විශේෂයෙන් චතාරික කාලය), පොර කමින් තවමත් පරිසිවර සම්ප්‍රදාය රැකීමට යොමුවන වන්දනා ගමන් හඹාගෙන යාමට තරම් නම්‍ය වුවද, අභිවෘද්ධි ආලේපන පන්නරය ඔස්සේ බව්තීස්මයේ ත්‍රිවිධ කාර්ය එදිනෙදා දිවිපෙවත තුළ පණ ගන්වමින් කිතු සමිඳාණන්ට සාක්ෂි දැරීමට අල්ප හෝ අවංක චේතනාවන් නොතිබීම කනගාටුදායකය.

**නිල පූජකවරය නැමැති දේව ප්‍රසාද නිධානයඃ**

බව්තීස්මය සහ අභිවෘද්ධි ආලේපයට අමතරව ක්‍රිස්මා ආලේපනය සම්බන්ධ වන ඊළඟ එකම දේව ප්‍රසාද නිධානය වනුයේ නිල පූජකවරයයි. තවද මේ සක්‍රමේන්තු යුගලය මෙන්ම නිල පූජකවරය ද ජීවිතයේ එක් වතාවක් පමණක් අයිතිකර ගත හැකි සක්‍රමේන්තුවකි.

හදවතේ සටහන් වන නොමැකෙන ලාංඡනය ඔස්සේ පූජක අපේක්ෂකයාව ක්‍රිස්තුන් වහන්සේට අනුරූපී කරවන අතර ඔහු කිතු සමිඳාණන්ගේ මෙවලමක් බවට පත්වන බව සාන්ත සභා මාතාව අපට උගන්වන්නීය. (ක.ස.ධ. 1581)

පූජකවරය මඟින් කෙනකුට සභාවේ හිස වන ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයකු මෙන් පූජක, දිවැසිවර සහ එඬේර කාර්යවල ඉතා ක්‍රියාශීලීව කටයුතු කරනට මාවත විවර වෙයි.

මුළුමනින්ම තම ජීවිතය දේව සේවය සඳහා යොමු කරනට මේ සමගම ඇරයුමක් ලැබෙයි. නොබෙදුණ ප්‍රේමයක් තුළ ක්‍රිස්තුන් වහන්සේගේ

දූත කාර්යයට ඉතා ප්‍රබල ලෙස සම්බන්ධ වීමට අවස්ථාව උදා වෙයි.

නිල පූජකවරය විශේෂ කැඳවීමක් නිසා එය තෝරාගත් පිරිසක් සඳහා පමණක් යොමුව පවතියි. "උත්පත්තියෙන්ම විවාහ විය නොහැකි අය සිටිති. මනුෂ්‍ය බලපෑම නිසා විවාහ විය නොහැකි අය ද සිටිති. ස්වර්ග රාජ්‍ය අරබයා සිය කැමැත්තෙන්ම විවාහ නොවන අයත් සිටිති" (මතෙව් 19/11-12).

දිව්‍ය පූජා යාගය තුළ පූජකවර දානය සිදුවන බව අපි දනිමු. එමෙන්ම ඒ පිළිවෙත් වෙත අවධානය යොමු වීමේ දී පහත සඳහන් අංග ද අප අවබෝධයට වැදගත් වනු ඇත.

- කීකරුකමේ පොරොන්දුව
- සියලු සාන්තුවරුන්ගේ පිහිට පතා යාච්ඤා කිරීම.
- අපේක්ෂකයන්ගේ හිස මත අත් තැබීම.
- කැප කිරීමේ යාච්ඤාව
- පළමු වරට පූජක ඇඳුම් (දයාවරණ/Chasubles) පැළඳ වීම.
- ක්‍රිස්මා ආලේපනය (SC)
- අපේක්ෂකයාගේ දෑත් ආලේප කිරීම (දෙඅත්ල)

**සමාප්ති සටහන**


මේ දේව ප්‍රසාද නිධාන ත්‍රිත්වය අප අවධානයට නතු කරනට උත්සුක වූයේ එහි ස්වභාවය ඉස්මතු කරලමින් ක්‍රිස්මා තෛලය මඟින් ඉස්මතු වන දූත කාර්යයට විශේෂ යොමුවක් ඇති බව පසක් කරමිනි.

මෙලෙස සැලකීමේ දී බව්තීස්මීය ප්‍රදානයට නතු වූ සැම අයෙක්ම ධර්මදූතවරයෙකි. ධර්මදූතික කාර්යය හා නිතැතින්ම බැඳී පවතින කිතුනු පැවැත්මෙහි උදාරත්වය කැපී පෙනෙයි. ශුද්ධාත්ම වරම් ලැබෙනුයේ ද මේ දූත කාර්යය සාක්ෂි දැරීම සඳහාමය.

තවද, බව්තීස්මය අඩිතාලම මත ගොඩනැගෙන නිල පූජකවරය නැමැති දේව ප්‍රසාද නිධානය, මේ සමස්ත ව්‍යුහයේ විශේෂත්වයක් උසුලන බව නොරහසකි.

**ගරු ඉන්ද්‍රා රත්නසිරි ප්‍රනාන්දු පියතුමා**
මීසම් සේවක - ලුනාව, අඟුලාන

# අමිතගේ හද ගැස්ම......



## WORSHIP AND LIFE : PAULINE PERSPECTIVE



Through this write up I would like to invite you all to see the connection between liturgy and life in the Pauline perspective. Life and worship are interconnected. We cannot separate liturgy and life for one flow to the other.

**Community celebration**

Worship is always a community celebration. The introductory rites at, the eucharist calls the people of God to be a celebrating community. It serves also as a "call to worship" together in communion with one another. Our liturgies are always a community exercise and not a private enterprise. At the very outset we begin by invoking the name of the Holy Trinity a symbol of communion. As soon as the celebration of the Holy Eucharist begins the presider greets the community in these following words "the grace of our Lord Jesus Christ and the love of God and the fellowship of the Holy Spirit be with you (2Cor.13:13). This is how it has been from the early days. (Romans1:7, 1Cor.1:3, 2Cor.1:2, Galatians 1:3). Paul begins and ends his epistles with these blessings. It is an invitation to all who gather and disperse (after) to experience the grace of God in communion with him and others.

**Paschal Mystery the Foundation**

A strong foundation is a must for a strong building. Similarly, the foundation of our worship is Christ's Paschal Mystery. The faith of the people rests solidly on the foundation of the passion, death, and the resurrection of Jesus Christ. Worship is a moment where we come together with our head, Jesus, to offer worship to God our Loving Father in the Holy spirit. Every liturgy is reciprocal; it has an ascending and a descending element. In our Liturgy we glorify the Lord (ascending) and he grants us his grace (descending). Jesus's life was a sacrifice, he gave his life so that we may have life in abundance (Jn. 10:10). Similarly, Paul gave his life for Christ (Gal.1:1-4, 6:14) as a sacrifice. "For I am already being poured out like a drink offering, and the time for my departure is near. I have fought the good fight, I have finished the race, I have kept the faith. Now there is in store for me the crown of righteousness, which the Lord, the righteous Judge, will award to me on that day—and not only to me, but also to all who have longed for his appearing" (2Timothy4:6-8). We too are also called to live our life as a sacrifice for the well-being of others.

**Liturgy builds A relationship**

Corinth was an important city for Paul. The people at Corinth gathered regularly to celebrate the last supper of the Lord. In their gathering Paul felt something was missing. Yes, the rich people through their actions humiliated and insulted the poor. Life and worship did not go together (1Cor 11: 17-33), when they come together for worship more damage was done than good. The rich came together and ate together before the poor arrived. It was awesome disgraceful behaviour. Hence, Paul criticizes the people who damage the Christian community. Paul challenges the community not to eat and drink unworthily. "For as often as you eat this bread and drink the cup, you proclaim the death of the Lord until he comes. Therefore, whoever eats the bread or drinks the cup of the Lord unworthily will have to answer to the Lord. A person should examine himself, and so eat the bread and drink the cup worthily. For anyone who eats and drinks without discerning, brings judgment on himself. That is why many among you are ill and infirm, and a considerable number are dying" (1Cor.11:26-30)

## Liturgy abolishes differences

The Corinthian community had many divisions among themselves, saying they belong to Cephas, Apollo, and to Christ (1Cor.1:12), Paul who saw this division like a good shepherd advises them to avoid division and be united through his admonition he asks them to be united to one another. In chapter 12 he speaks of unity in diversity. A variety of gifts proceed from the same source, all given for the common good of the community. "The eye cannot say to the hand, "I don't need you!" And the head cannot say to the feet, "I don't need you!" On the contrary, those parts of the body that seem to be weaker are indispensable, and the parts that we think are less honorable we treat with special honor. And the parts that are unpresentable are treated with special modesty, while our presentable parts need no special treatment. But God has put the body together, giving greater honor to the parts that lacked it, so that there should be no division in the body, but that its parts should have equal concern for each other. If one part suffers, every part suffers with it; if one part is honored, every part rejoices with it" (1Cor.12: 22-26).

## Grace flows from Liturgy

The Corinthian community celebrated their liturgy as a ritual. They were living a loose life and had no morals, and were moving towards earthly values. When they were at worship, they had one life style and outside followed another having Jealousy, and fights 1Cor.3:3. here Paul reminds them that they are the temples of the Holy Spirit (1Cor.3:16-17, 1Cor. 6:13). The Church is sacred similarly ,our body is sacred too, so keep it pure. Also, he invites the Roman community, "I appeal to you therefore, brothers and sisters, by the mercies of God, to present your bodies as a living sacrifice, holy and acceptable to God, which is your spiritual worship" (Rom.12:1).

**Rev. Fr Andrias Fernando O.M.I.**
Oblate Scholasticate - Ampitiya

# ජුබිලි වසර ඇරඹුණා

එකසිය විසිපස් වසරක් පුරා පෙරට සපැමිණී
භක්ති ප්‍රබොධනේ ජුබිලි වසර මෙදා ඇරඹුණී
උතුරා යන හදපතුලේ ඉන් සොම්නස අපමණී
බෙදාගනිමු නේද ඉතින් එය බැතියෙන් මිතුරනි

වසරේ දස මාසයක්ම අපව සොයා පැමිණියා
සැවොම පුබුදු වුණෙමු ගෙනෙන පණිවුඩ හද තුළ තියා
සැනසෙන්නට ලැබුණී අපට කිවයුතු දේවල් කියා
දුන් හැටි මතකය නිතරම ඒ වෙනුවෙන් ඉඩ සොයා

පවුල් අවුල් වෙන්න නොදී පෙන්වන ලද මාවත
හැම වයසක සැමටම ගැලපෙන නොවෙමින් සීමිත
පණිවුඩ ගෙනෙනා හරබර සැමදෙන වෙත පා මෙත
පවුලේ සඟරාවයි මෙය සුරකින දිවි මීවිත

පුදකරමු පළමුවෙන්ම හද තුළ මැවෙනා තුති
සඟවාගෙන නොසිට සතුට හදේ මැවෙන නිම නැති
බල තණ්හාවට එරෙහිව පබැඳුවෙමි කවි නිති
බැටදුනිමි අයුක්තියට පිලකට නොවෙමින් ගැති

කවි කියවා පළමුවෙන්ම රස වින්ද සොඳුරිය
කවි ලියනා තුරු ළඟ හිඳ මට තනි රැක්කා ඇය
කවි මැවෙනා සිතට මගේ තිබුණු සවිය එය විය
කවි ගෙනෙනා සුවය නිවයි දුක ඇය ලොව හැර ගිය

බාධක මැද දැන් එන දෙමසකට වරක් නොනැවතී
ලිපි කවි කෙටි කතා තියන පුබුදුවනා සිත් බැතී
ආදරය වෙනුවෙන් නැතුවම බැරි ඉඩ දෙන නිතී
ප්‍රබොධයකි ප්‍රබොධනය ගෙන එන්නේ නිම නැතී

විවාහයේ අපේ ස්වර්ණ ජුබිලිය මේ වසරෙම
යෙදී තියෙන බව පවසමි සතුටින් නොවෙනා නිම
ඇයද ප්‍රබොධනය වගෙම විය මට හැම දා කම
ජුබිලි දෙකම එකට වැටුණු සොම්නස විඳිමි මම

ජුබිලි පැවැත්වූ අන්දම එදා සිටම මිහි මත
ශුද්ධවූ බයිබලයේ හොඳහැටි සඳහන් වී ඇත
නිමිත්ත මෙය වෙයි සොම්නස උතුරා යන්නට සිත
පවත්වමු සැවොම තුටින් අපි එය සලසන සෙත

**පස්කල් ජයමාන්න - උස්වැටකෙයියාව**
(ඇයද ප්‍රබොධනය වගේම විය මට හැමදාකම)

# අඛණ්ඩ යැදුමක් කළ ප්‍රාතිහාර්යය

අපේ පවුලේ ඉන්නෙ මමයි නෝනයි පුතාලා දෙන්නයි. අපි දෙන්නම වැඩ කළේ සෞඛ්‍ය සේවයේ. දැන් අපේ සේවා කාලයට අවුරුදු තිහක් පමණ වෙනවා. මම කොළඹ ජාතික රෝහලෙත් මගේ බිරිඳ ජයවර්ධනපුර රෝහලෙත් දැන් මීගමුව රෝහලෙත් වැඩ කරනවා. ජේසුත් එක්ක පල්ලිය/ගම එක්ක ළඟින් හිටපු පවුලක් අපි. සෞඛ්‍ය සේවයේ නිසාත් මිනිස්සුන්ට උදවු කරන්න තියෙන අවස්ථා වැඩි නිසාත් පුළුවන් හැම විටම අඳුනන නාඳුනන හැම කෙනකුටම උදවු කළා උපරිමයෙන්.

අප දෙදෙනාම රජයේ සේවයේ නියැලීම නිසා පුතුන් දෙදෙනාගේ උසස් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේ අරමුණින් මා මීට වසර අටකට පමණ පෙර විදේශ ගත වුණා. විදේශයේදීත් මා හැකි පමණ ශ්‍රී ලාංකික අයට උදවු කළා. ඒ රෝහලට සිටි එකම ශ්‍රී ලාංකිකයා මා පමණක් වීමත් එයට හේතුවක් වුණා.

බිරිඳ සහ දරුවන් දෙදෙනා ලංකාවේ ජීවත් වුණා. ඒ අතර වැඩිමහල් පුතා වැඩිදුර අධ්‍යාපනය සඳහා විදේශගත වුණා. පොඩි පුතාත් උසස් පෙළ හදාරා විදේශගතවීමට සැලසුම් කර තිබියදී හදිසියේම ඇති වූ බෙල්ලේ ඉදිමීමක් නිසා හා අධික උණ රෝගයෙන් පෙළීම නිසා අප නොසන්සුන් වුණා. ගෙඩිය ඇති ස්ථානය එතරම් සුබදායක නොවන නිසාත් වහා පරීක්ෂණ වලට යන ලෙසත් මා එතෙර සිට බිරිඳට දැන්වුවා. පරීක්ෂණ ගණනාවකින් පසු අවසානයේ මහරගම අපේක්ෂා රෝහලේ ඇටමිදුලු පරීක්ෂණයට යොමු කළ යුතු බව වෛද්‍ය වාර්තාවලින් දැන්වීමත් සමඟ

රෝගීන් දස දහස් ගණනකගේ රෝගී තත්ත්වය ගැන අත්දැකීම් තිබූ අප දෙදෙනාට මෙය දරා ගැනීමට නොහැකිවීම මනුෂ්‍යයන් හැටියට මා පුදුම වන්නේ නෑ. ඒ සමග මාත් බිරිඳත් එකම ඉලක්කයක් මත දෙවිඳුන් කෙරේ විශ්වාසය තබාගෙන සිටියා. මගේ බිරිඳ එක දිනයක්වත් අතපසු නොකර හැඬූ කඳුළින් දෙවියන්ට යාච්ඤා කළා. මරිමවුන්ගේ මැදිහත් වීම අයැද සිටියා.

මේ දිනවල රට තුළ ඉතාමත් අයහපත් තත්ත්වයක් මතුවී තිබුණා. කොරෝනා වසංගතය/ ගෑස් සහ ඉන්ධන අර්බුදය හමුවේ දස දහස් ගණන් වාහන සහ මිනිසුන් මහමග කල්ගත කළා. බිරිඳත් පුතාත් මේ වන විට ලංකාවේ සිටිය බැවින් මේ පරීක්ෂණ හා වෛද්‍ය හමුවීම සඳහා සතියකට දෙතුන් වතාවක් කොළඹට යාමට සිදුවීමත්, පුතාව බාහිර සුළු ආසාදන වලින් පවා ආරක්ෂා කර ගැනීමට වෛද්‍ය උපදෙස් දී තිබූ නිසාත් පොදු ප්‍රවාහන සේවය යොදා ගැනීමට අපට නොහැකි වුණා. ඒත් පවතින ඉන්ධන හා අර්බුද හමුවේ වාහනයක් හා ඉන්ධන සොයා ගැනීම ඉතා අසීරු කටයුත්තක්ව තිබුණත් අප දෙවිඳුන් කෙරෙහි තබා තිබූ විශ්වාසය සමඟින් මාගේ සමහර හිත මිත්‍රාදීන් සහ සමහර නෑදෑයින් අපට උදව් උපකාර කළේ අවංක සිතින්. අවසානයේ රෝග පරීක්ෂණවලින් පසු එය ලිව්කේමියා (Leukemia) රෝග තත්ත්වයක් බව හඳුනා ගත්තා.

පුතාගේ විදේශ ගමනේ සැලැස්ම වහා වෙනස් කර වෛද්‍ය ප්‍රතිකාර ආරම්භ කළා. ආයුර්වේද හා වෙනත් අදෘශ්‍යමාන බලවේග කරා යොමුවන ලෙස අපට පෙලඹවීම් ආවත් අප දන්නා බටහිර වෛද්‍ය විද්‍යාව කෙරෙහි අප විශ්වාසයෙන් සිටියේ දෙවිඳුන්ගේ මඟ පෙන්වීම තුළයැයි මට සිතෙයි. රජයේ සේවකයන් දෙදෙනකු ලෙස සිට මා විදේශගතවී සිටීමත් ඒ වන විට වැඩිමහල් පුතාගේ අධ්‍යාපනය වෙනුවෙන් යම් මුදලක් අත ඉතිරි කර තිබීමත් නිසා මේ අර්බුදකාරී තත්ත්වයට මුහුණ දීමට අපට හැකි වුණා. රටේ පැවති තත්ත්වය හා රෝග ප්‍රතිකාර මිල අධික ඖෂධ සඳහා අති විශාල මුදලක් දැරීමට සිදුවුණා. ඒත් හැම විටම මා සමග අත්වැල් බැඳගත් සමහර හිත මිත්‍රයන් වගේම සමහර නෑදෑ පිරිසකුත් සිටියා. විශේෂයෙන්ම මේ රෝගී තත්ත්වයේදී ශරීරයේ ප්‍රතිශක්ති පද්ධතිය දුර්වල වී දැඩි බලපෑමක් ඇති කරන නිසා සැම විටම දරුවා ඉතා කුඩා ආසාදන වලිනුත් පරිස්සම් කර ගැනීමට වෛද්‍ය උපදෙස් ලැබුණා. කොරෝනා දැඩිව තිබූ කාලයක් නිසා අමුත්තන් මුළුමනින්ම පාලනය කරමින් අපේක්ෂා රෝහලේ ගෙවන වාට්ටුවේ කාමරයක මගේ බිරිඳත් දරුවාත් වෛද්‍ය කාර්යමණ්ඩලයත් පමණක් සීමා කරමින් ප්‍රතිකාර පටන් ගත්තා. මගේ බිරිඳ වසරක වැටුප් රහිත නිවාඩු ලබාගෙන දරුවා සමඟ ප්‍රතිකාරවලට නැවතී පුරා මාස තුනක් පමණ ඒ කාමරය තුළ

පුටුවක් මත රාත්‍රිය ගත කරමින් දරුවා බලා ගත්තා.

හදිසි නිවාඩු ලබා ලංකාවට පැමිණි මා කෙළින්ම ගුවන් තොටුපළේ සිට අපේක්ෂා රෝහලට යමින් සිටියදී ඇයගෙන් මා හට උපදෙස් ලැබුණේ එසේ නොඑන ලෙසයි. ඉන්පසු මා මිතුරකුගේ නිවසට ගොස් ස්නානය කර පිරිසිදු වී වෙනත් ඇඳුමක් මාරු කර මුඛ වැස්මක් සහිතවයි පුතා බැලීමට වාට්ටුවට ඇතුළු වූයේ.

ඒ වන විට ඔහුගේ පිළිකා ප්‍රතිකාර පටන්ගෙන තිබූ අතර ඔහුගේ හිසකෙස් සැහෙන ප්‍රමාණයක් ගැලවී යාමට පටන් ගෙන තිබුණා. අවුරුදු 21ක තරුණ වයසේ සිටින දරුවකු වන ඔහු එය කෙසේ දරා ගත්තා දැයි අපටත් පුදුමයක් උනා. ඒ සමගම ඒ දරුවා දෙස අප දෙදෙනාටම බලා සිටීම උහුලාගත නොහැකි වේදනාවක් වුවත් දෙවිඳුන් තුළ අප ඒ සියල්ල දරා ගත්තා.

මා කෙලින්ම වාට්ටුවට ඇතුළුව කිසිම වෙනසක් නොපෙන්වා සිනාමුසු මුහුණින් ඔහු හමුවට ගිය විට ඔහුද කිසි වෙනසක් නොපෙන්වා සිනාමුසු මුහුණින් මට මුහුණ දීම මා තුළ දැඩි ශක්තියක් ඇති කළා. මා පුරා මාසයක් නිවාඩු ලබා ඔහුත් සමග සිටියා. ඒ අතරතුර ඔහුට ලබාදෙන ප්‍රධාන **නික්ෂේපන** (පිළිකා නාශක එන්නත්) ඖෂධවල යම් අතුරු ආබාධ තත්ත්වයක් තවත් රෝගීන්ගෙන් පවා වාර්තා වීම නිසා වහාම ඒ ඖෂධය වෙනස් කර තත්ත්වයෙන් උසස් ඖෂධයක් භාවිත කරන ලෙස වෛද්‍ය උපදෙස් ලැබුණා. ඔහුගේ පාදවල හදිසියේම හටගත් දුර්වල තත්ත්වය නිසා ඇවිදීමට පවා අපහසු වුණා. විශේෂඥ උපදෙස් මත දරුවාව, පෙර මා සේවය කළ ජාතික රෝහලේ ස්නායු වෛද්‍ය අංශයට ඇතුළත් කර ප්‍රතිකාර කිරීමට සිදුවුණා. ඒ ප්‍රතිකාර සමඟ දින කීපයකින් නැවත මහරගම රෝහලට මාරු කර පිළිකා ප්‍රතිකාර නැවත පටන් ගත්තා.

අතුරු ආබාධ පිළිබඳ සැලවීමත් සමඟ මා ඒ සඳහා වෙනත් ඖෂධයක් සෙවීමට රටවල් ගණනාවකින්ම විමසා බැලුවත් පිළිකා ඖෂධයක් නිසා එය ආනයනය කර ගැනීම විශාල අසීරු කටයුත්තක් වුණා. ඒ කෙසේ වෙතත් විශාල ආයාසයක් දරමින් ජර්මන් රටින් මෙරටට ඖෂධ රැගෙන ආවත්, රටේ පවතින ඖෂධ මාෆියාව හමුවේ නිත්‍යානුකූලව වුවත් රටට ඒවා ඇතුළු කර ගැනීම අති දුෂ්කර කටයුත්තක් වුණා. ඒ කාලය වන විට මගේ ග්‍රාමයේ පල්ලියේ මංගල්‍යය ළංව තිබීම නිසා වික්ෂෝප මාතා සුරුවම ගම වටා කිතුනු ඒකකවල නිවසින් නිවසට රැගෙන යමින් නොවාන පැවැත්වුණා. ඒ සැම ගෙදරකදීම සැම නොවානයකදීම මාගේ දරුවා සිහිකර ඔහු වෙනුවෙන් යාච්ඤා කිරීමද කරන බව මා හට අසන්නට ලැබුණේ ගමේ විවිධ ප්‍රදේශ කිහිපයකින්. දෙවිඳුන් තුළ ඒ එකමුතුවීම මගේ ධෛර්යය වැඩි කිරීමට ලොකු ශක්තියක් සහ අපට දෙවිඳුන් තුළ විශ්වාසය තවත් වැඩි කළා.

**වසරකටත් වඩා වැඩි කාලයක් ප්‍රතිකාරවලින් පසු නැවතත් ඇටමිදුලු පරීක්ෂණයකින් පුතාගේ තත්ත්වය සාමාන්‍ය බව වෛද්‍ය වාර්තාවෙන් දැනගත්තා. අප නැවතත් එය ස්ථිර කර ගැන්ම සඳහා ඒ සාම්පල ඉන්දියාව වෙත යවා තවදුරටත් වාර්තාව සනාථ කරගත්තා. ඉන්පසු ඔහුගේ** Maintenance ඖෂධ ආරම්භ කිරීමත් සමග මාගේ පුතා අදහස්කර සිටි පරිදි ඔහුගේ ඉගෙනීම් කටයුතු සඳහා විදේශ ගතවීමට වෛද්‍ය අනුමතිය ලැබුණා. අද ඔහු විදේශයක වෛද්‍ය විද්‍යාව හදාරමින් ඔහුගේ පළමු වසර නිම කරමින් පවතිනවා. **අප සමිඳුන්ගේ මේ ක්‍රියාව ගැන ප්‍රාතිහාර්යයක් සේම බොහෝ මව්වරුන්ට මහා ආදර්ශයක් වූ බවයි මාගේ හැඟීම. ජේසුගේ මේ බලවත් ක්‍රියාවට ස්තුතියත් ප්‍රශංසාවත් අත්වනු සඳහා මෙය ඔබට සාක්ෂි දැරීමට බොහෝ මව්වරුන්ට මහා ආදර්ශයක් වූ බවයි මාගේ හැඟීම. ජේසුගේ මේ බලවත් ක්‍රියාවට ස්තුතියත් ප්‍රශංසාවත් වනු සඳහා මෙය ඔබට සාක්ෂි දැරීමට අදහස් කළා.**

**පුෂ්පමාල් ප්‍රනාන්දු - කඳවල**

දිව්‍ය පූජාවේ ..... 11 වන පිටුවෙන්

විදහා දක්වන චින්තනය සනාථ කිරීම සඳහා ද, ඇතැම්විට මේවා රෝමයේ පාප් වහන්සේලාගේ දේවල් බව කියමින් ඒවාට සෘණාත්මක ප්‍රතිචාර දක්වීම අරබයා ද සිදුකරන බොහෝ වෙනස්කම් නිසා දැඩි බලපෑමකට ලක්ව ඇත්තේ පිළිවෙතේ අත්තිවාරම වන එහි දේව ධාර්මික අත්දැකීම යි.

මේ කෙටි ලිපිය කියවා, අවම වශයෙන් ඒ ගැන විමසිලිමත් වන්නට සහ එය හදරා අත්දකින්නට කිසියම් පෙලඹවීමක් සිදුවූයේ නම්, මෙහි රචකයා ඒ මහිමය පුද කරන්නේ ද දේව බැටළු පෝතකයාණන් වහන්සේටම ය.

# යාම යැදුම

"යාම යැදුම" යන වචනය බොහෝ ගිහි ජනතාවට නුහුරු, නුපුරුදු වචනයකි. සාම්ප්‍රදායිකව යාම යැදුම හෙවත් සභාවේ නිල යැදුම, පූජක පැවිදි කාර්යයක් ලෙස සලකනු ලැබීය. එහෙත් මෑතක සිට මන්දගාමීව වුව ද ගිහි සැදැහැවත් ජනතාව අතර මෙය ක්‍රමානුකූලව ප්‍රචලිත වෙමින් පවතින බව දක්නට ඇත. එවැනි පසුබිමක් තුළ 'යාම යැදුම' යනු කුමක් ද? එය සභා ජීවිතයට මෙන්ම ගිහි ජනතාවට ද වැදගත් වන්නේ මන්ද යන්න පිළිබඳව කෙටියෙන් හෝ විමසීම වැදගත් යැයි හැඟේ.

**යාම යැදුම ලෙස හඳුන්වන්නේ කුමක් ද?**

යාම යැදුම යනු දවසේ නිශ්චිත කාලවල විශේෂයෙන් ශුද්ධවූ බයිබලයේ ගීතාවලියේ තෙහිලි ගී ඇසුරින්, ක්‍රමානුකූල පිළිවෙතක් අනුගමනය කරමින් සමස්ත සංඝයම එක්ව දෙවියන් වහන්සේට කරන ප්‍රශංසාවයි. මෙය දවසේ විවිධ 'යාම' වලදී සිදුකරන බැවින් 'යාම යැදුම' ලෙස නම්කර ඇත. විශේෂයෙන් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසුව මෙය ඉංග්‍රීසි භාෂාවෙන් Liturgy of the Hours ලෙස හඳුන්වන අතර එය 'යාම යැදුම' ලෙස සිංහලට පරිවර්තනය කර ඇත. අතීතයේ මෙය දේව රාජකාර්යය, නිල යැදුම (the Divine Office) යන නම් වලින් හැඳින්වූවත් වර්තමානයේ එය යාම යැදුම ලෙස නම් කරනු ලබන්නේ එහි ප්‍රධාන පරමාර්ථයක් වන දේව ප්‍රශංසාව තුළින් කාලය, දවස පරිශුද්ධ කිරීම යන්න වඩාත් තීව්‍රව ඉදිරිපත් කිරීමටයි.

**යාම යැදුමේ ආරම්භය**

යාම යැදුම මෑත කාලීනව හඳුන්වා දෙන ලද නව යැදුම් ක්‍රමයක් නොවේ. එහි ආරම්භය අපට හමුවන්නේ ජුදා යැදුම් සම්ප්‍රදාය තුළයි. ජුදා ජාතිකයන් දවසේ නිශ්චිත කාලවල දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ බව ශුද්ධවූ බයිබලයේ සඳහන්වේ. දිනපතා තෙවරක් එනම් උදෑසන, දහවල් සහ සවස යන කාලවල දී ඔවුන් එසේ යාච්ඤා කර ඇත. උදා: දානියෙල් 6,10 - "පුරුදු පරිදි දිනකට තුන් වරක් දණින් වැටී තමාගේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි යාච්ඤා කොට ස්තුති පුද කෙළේය". එවැනි බොහෝ අවස්ථාවල තෙහිලි ගී ගායනා කරමින් ඔවුහු යාච්ඤා කළෝය. විශේෂයෙන්ම මෙය පුරාණ ජුදා සම්ප්‍රදයක් වන උදෑසන සහ සවස දේව මාලිගාවේ සිදුකරන දවන යාග පූජාව හා සම්බන්ධයක් ඇත. ඒ යාග සිදුවන අවස්ථා වලදී තෙහිලි ගී සජ්ඣායනය කිරීම එහි අනිවාර්ය අංගයකි. රබ්බිවරුන්ගේ ඉගැන්වීම්වලට අනුව සෘජුවම දේව මාලිගාවේ යාග පුදන අවස්ථාවට සහභාගි විය නොහැකි ජනතාව ඔවුන් සිටිනා ස්ථානවල සිට ඒ යැදුම් උච්චාරණය කිරීමට පුරුදු වී සිටියහ. රබ්බිවරුන්ගේ රීතිවලට අනුව යැදුම (සජ්ඣායනය) යාගය ස්ථිර කරන අතරම එය යාගය හා සහසම්බන්ධව පවතින ඉන් වෙන්කළ නොහැකි අනිවාර්ය අංගයකි. ඒ අනුව යැදුම, ජනතාව, යාගය හා සම්බන්ධ කරන සහ එයට අර්ථය ගෙනදෙන මාර්ගය විය. එමෙන්ම දේව මාලිගාව විනාශ වී විප්‍රවාසගත වූ ජනතාවට තවදුරටත් යාග පූජා පැවැත්වීමට නොහැකි වූ අතර එයට ආදේශකයක් ලෙස සිනගෝග යැදුම් මෙහෙයන් වර්ධනය විය. දවසේ නිශ්චිත කාලවල මේ 'පැසසුම් පූජා' ඔප්පු කිරීම ජුදා වන්දනා සම්ප්‍රදායේ අනිවාර්ය අංගයක් බවට පත්විය. එම යැදුම් සඳහා ඔවුන් භාවිත කළේ තෙහිලි ගීත හා ශුද්ධ ලියවිලි පාඨයි. ගීතාවලිය ජුදා ජාතිකයන්ගේ යැදුම් පොත විය.

ශුද්ධවූ සුවිශේෂවල සඳහන් වී ඇති සාක්ෂි අනුව ක්‍රිස්තුස් වහන්සේ යාච්ඤා කළ අයුරු පිළිබඳව යම් අවබෝධයක් අපට ලබාගත හැකිය. උන්වහන්සේ නිතර සිනගෝගයට ගිය බවත් ජුදෙව්වකු ලෙස ඔවුන්ගේ සාම්ප්‍රදායික යාම යැදුම්වලට සහභාගිවූ බවත් සඳහන් වේ. තෙහිලි ගී උන්වහන්සේගේ ජීවිතයේ කොටසක් ව තිබූ බවට උන්වහන්සේගේ දේශනා සහ යාතිකා සාක්ෂි දරයි. ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවකයෝ ද ජුදා යැදුම් ක්‍රමය භාවිත කළහ. මුල් කිතුනු සභාව තුළ යැදුම් සම්ප්‍රදාය හැඩ ගැසෙද්දී තෙහිලි ගී මත පදනම් වූ යැදුම් ක්‍රමය විශේෂ තැනක් ගත්තේය. එමෙන්ම මුල් කිතුනුවෝ දවසේ නිශ්චිත කාලවල සියලුදෙනා එක්රැස්ව තෙහිලි ගී ගායනා කරමින් යාච්ඤා කර ඇති බවට සාක්ෂි ඇත.

සතරවන සියවසේ කිතුනුවන් හට ලැබුණු ආගමික නිදහසත් සමග යාම යැදුමේ වෙනස්කම් සිදුවන්නට විය. එය දෙයාකාරයකට වර්ධනය විය. රදගුරුතුමන්ලා, පූජකතුමන්ලා හා ජනතාව එක්ව දේවස්ථානවල පවත්වන යාම යැදුම 'ආසන

දෙව්මැඳුරු යාම යැදුම්' ලෙසත් තාපසාරාමවල තාපස තාපසිකාවන් විසින් සිදුකරන ලබන යාම යැදුම 'තාපසාරාම යාම යැදුම' ලෙසත් වර්ධනය වන්නට විය. තාපසාරාම යාම යැදුම ක්‍රම ක්‍රමයෙන් සංකීර්ණ විය. යාම යැදුම් සම්ප්‍රදාය ක්‍රමයෙන් ජනතාවගෙන් ගිලිහි ගොස් පූජක පැවිදි අයගේ ණය යුක්තියක් බවට එය පත්විය.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ දේව වන්දනාව සම්බන්ධව ගෙන එන ලද සංශෝධන මගින් යාම යැදුම නැවතත් දේව ජනතාව අතරට ගෙන යැමට රුකුලක් වන අයුරින් එය සරල කිරීම සිදුවිය. අභාග්‍යයකට මෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල තවමත් ලැබී නැත.

**යාම යැදුම වැදගත් වන්නේ ඇයි ?**

යාම යැදුම සකස්වී ඇති අයුරින් දවස මුළුමනින්ම ශුද්ධවන්තව ගත කරන්නට අපට උපකාරවේ. කිතුනු විශ්වාසයට අනුව සියලු කාලය අයිති දෙවියන් වහන්සේටය. එබැවින් උන්වහන්සේට ප්‍රශංසාව පුද කිරීමෙන් ඒ කාලය ශුද්ධවන්තව ගතකිරීමටත් උන්වහන්සේගේ ගැලවීමේ ක්‍රියාකාරීත්වය අත්දැකීමටත් හැකිවේ.

එමෙන්ම යාම යැදුමේ අප භාවිත කරන තෙහිලි ගී, ශුද්ධ ලියවිලි පාඨ සහ යැදුම්, මනුෂ්‍ය ජීවිතයේ විවිධ වූ අත්දැකීම් මෙනෙහි කරන්නට අප සැම යොමු කරයි. වේදනාව, සතුට, කනස්සල්ල, බලාපොරොත්තු සුන්වීම, ප්‍රශංසාව වැනි මනුෂ්‍ය අත්දැකීම් බහුලව ඉදිරිපත් කරන තෙහිලි ගීත භාවිතය තුළින් එවැනි විවිධ වූ මනුෂ්‍ය අත්දැකීම් සමගින් දෙවියන් වහන්සේගේ දයාව අත්දකින්නටත් උන්වහන්සේ හට ප්‍රශංසාව පුදකරන්නට සැදැහැවතුන් යොමු කරයි. යාම යැදුමට සහභාගිවන සැදැහැවතුන් එයට සහභාගි වන්නේ තනි පුද්ගලයන් ලෙස නොවේ. ඔවුන් මේ යැදුම තුළින් මුළු මහත් සංඝයේ ම යැදුමේ කොටස් කරුවෝ වන්නෝය. ඔවුන් තම තමන් මෙන්ම එකිනෙකා වෙනුවෙන් ද යදිමින් ජේසු සමිඳාණන් දෙව් පියාණන් වහන්සේ වෙත පුදන මහා ප්‍රශංසා යාගයේ හවුල්කරුවෝ වන්නෝය. යාම යැදුම මගින් සැදැහැවතුන් මුල් සභාව දක්වා දිවෙන සියවස් ගණනාවක් පැරණි යැදුම් සම්ප්‍රදායකට සම්බන්ධවේ.

අවසානකොට සඳහන් කළ යුත්තේ යාම යැදුම හුදෙක් පූජක පැවිදි අයට පමණක් සීමාවූ යැදුමක් නොව එය සමස්ත සභාවේම යැදුමකි. එය දවස පරිශුද්ධ කරයි, එක්සත්කම සහ සාංඝිකත්වය පෝෂණය කරයි. එමෙන්ම ආධ්‍යාත්මික ජීවිතයට අනුප්‍රාණයක් සහ මගපෙන්වීමක් ලබා දෙයි. යාම යැදුම අපගේ දෛනික චර්යාවට ඇතුළත් කර ගනිමු. එවිට ගැඹුරු දේව සම්බන්ධතාවක් ඇති කරගැනීමට මෙන්ම සභා ජීවිතයට වඩාත් පූර්ණ ලෙස සහභාගි වීමට ද එයින් ඉඩ සැලසේ.

**ගරු ජෝශප් ඉන්දික පියනම**
අගරදගුරු නිවස - බොරැල්ල

# සෙනහසින් ...ආරාධනා ... ආරාධනා... කරමු ...

**2024 අප්‍රේල් 23 වන පුරපසළොස්වක පෝ දින ආධ්‍යාත්මික වැඩ මුළුවක් සූදානම් කර ඇත.**

ස්ථානය : මරදාන පාතිමා දෙව්මැදුරේ, සමාජය හා සාමයික කේන්ද්‍රයේ ශාලාව
වේලාව : උදෑසන 8:30 ට ආරම්භය
නිමාව : සන්ධ්‍යාවේ 4.30 යි

**භක්ති ප්‍රබෝධනයට සම්බන්ධ ලේඛක ලේඛිකාවන්ට, බෙදාහරින්නට දායක වන සියලු දෙනාටම, පාඨකයන් ඇතුළු මේ ගැන උනන්දුවක් දක්වන ඕනෑම කෙනෙකුට ආරාධනා කරමු. ඔබත් සහභාගි වන්නට කැමැති නම් මාර්තු මස 31 වනදාට පෙර අපට ලියන්න.**

සංස්කාරක පියතුමා
භක්ති ප්‍රබෝධන වැඩමුළුව
නො. 265, පාතිමා දෙව්මැදුර. ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.

# මෝසැසි පෙරේරා මාහිමි

මෝසැසි පෙරේරා මාහිමිපාණන්ගේ ගීතිකා සමූහයේ හැඩරුව විමසා බැලීමේ දී ඉතා පැහැදිලි අයුරින් අපට පෙනෙන කරුණ වනුයේ පියතුමකු ලෙස පූජක දිවියේ කැපවීම, දේව කරුණාවේ තරම මනාව ජීවිත අත්දැකීමෙන් හසුකර ගෙන එය දෙවියන්ට පුදන සුවඳ දුමක් සේ දැකිය හැකිවන්නේ උන්වහන්සේගේ ජීවිතය පුරාම මුහුකුරා ගිය දේව විශ්වාසය යි. දේව විශ්වාසය හැඩවැඩ ගන්නේ දේව ජනතාවගේ හදවත් ශ්‍රද්ධාවෙන් පුරවා දෙවි මහෝත්තමයාණන්ට සමීප වන්නට වරයක් ලබා ගැනීමත්, ඒ වරය දේව ජනතාව අතර විකසිත වූ පුෂ්ප ගොන්නක් සේ නිර්මාණය කිරීමයි. මේ සඳහා දේව විශ්වාසය, දේව කරුණාවේ අනුග්‍රහය සැබවින්ම ජීවිතය පුරා දෝලනය විය යුතුය. ඒ සමගම හදවතින් ජනිත වන ශ්‍රද්ධාව, භක්තිය ප්‍රකාශ කිරීමට භාෂාව සැබවින්ම වාහකයක් වන්නේ ය. මෙය නිදි කිරා වැටි වැටී සිදුවන්නක් නොව ඉමහත් ආයාසයකින් යුතුව දැඩි ගැඹුරු විශ්වාසයකින් යුතුව සකස් වන්නකි.

මෝසැසි පෙරේරා මාහිමිපාණන්ගේ ගීතිකා සමූහය ගැන කථා කරන විට උන්වහන්සේගේ ජීවිතයට ඉමහත් සම්බන්ධතාවක් පැවති, සුප්‍රසිද්ධ සංගීත, ගීතිකා මවන්නට හැකියාව තිබූ කෘතහස්ත පිරිසක් උන්වහන්සේ වටා සිටියහ. දේශීය සංගීතය පිළිබඳව සැලකීමේ දී සුනිල් ශාන්තයන්ගේ පුරෝගාමීත්වය අප ඉමහත් බැතියෙන් යුතුව සිහිපත් කළ යුතුව ඇත. එතුමා මෝසැසි පෙරේරා මාහිමිගේ ඥාතියෙකු වීම සැබෑ දායකත්වයක් ලබාදෙන්නට පිටිවහලක් විය. මෝසැසි පෙරේරා පියතුමාගේ මුල් ගීතිකා වල සංගීතය, ගායනය සුනිල් ශාන්තයන්ගේ වූ අතර, ඔහුගේ ගෝලයකු ලෙස සැලකීම ලද අයිවෝ ඩෙනිස් ගායනයෙන් දැක්වූයේ ඉමහත් හසළ කුසලතාවකි. අද මේ දෙපළ ගැන කථා කිරීමේ දී කතෝලික සභාව සහ අප ශ්‍රී ලාංකික ජනතාව ඉමහත් බැතියෙන් යුතුව සලකන්නේ ය. ඒ සමගම හලාවත පදවියේ දේව වන්දනාව සහ සංගීතය පෝෂණයෙ හි ලා දායකවුණු පුද්ගලයෙකි ජේ. කේ. ඇස්. පෙරේරා.

මෝසැසි පෙරේරා පියතුමා පිළිබඳ කරුණු විමසද්දී, අප දේශීය භාෂාව වන සිංහල ඉමහත් ලෙස ප්‍රගුණ කළ අතර, එවකට ඒ ඔස්සේ නමක් දරා සිටි "හෙළ හවුල" පියතුමාගේ හදවතට ඉතා සමීපව පැවතුණි. මේ කරුණු උරගා බලන්නට අප කළ යුත්තේ උන්වහන්සේ රචනා කළ ගීතාවලියේ ගීත හඳුනාගෙන ඒවා විමසා සිටීමයි. දේව වන්දනාව ගැන කථා කිරීමේ දී, දේව වන්දනාව සජීව ක්‍රියාවලියක් ලෙස නිර්මාණය කිරීමට පියතුමා විවිධ ක්ෂේත්‍රවලින් තම ගීතිකා නිර්මාණය කළ අතර, අපගේ පහසුව සඳහා උන්වහන්සේ නිර්මාණය කළ ගීතිකා දේව වන්දනාව අනුසාරයෙන් මෙසේ වර්ග කරන්නට හැකිය.

1. ගැයුම් පුද කිස ගී (Mass)
2. වැඳුම් පිළිවෙත් ගී (Liturgical Hymns)
3. තෙහිලි ගී (Psalms)
4. වෙනත් විවිධ ගී (Varia) යනුවෙනි.

**ගැයුම් පුද කිස ගී**

ගැයුම් පුද කිස ගී යන්නෙන් ප්‍රකාශ වනුයේ ක්‍රිස්තුස් ස්වාමිදරුවන්ගේ මහිමය ජීවිත පූජාවේ ආත්මයයි.

උදා: 1. "මහිමේ උස් මණ්ඩලේ සුරිඳුන් හට අයත් වේ ..."
2. "දෙවි අජබාලකයෝ ..."
3. "මොනවට ඔබ මට පඩුරු ගෙනාවේ ..."
4. "හද බැති තුති මල් පොකුරු තිළිණ කොට ..."
5. "තෙල් මල් සුවඳ සඳුන් ..."

**වැඳුම් පිළිවෙත් ගී** (Liturgical Hymns)

උදා: 1. "බාරගන්න සමිඳුනේ හැම නිදහස මගෙ සිතේ ..."
2. "අප ගැන මඳකුත් නොතකා ..."
3. "දක්වත ඔබ මගෙ ඉතා ..."
4. "දෙවි සමිඳුන් අප හට දුන් ..."
5. "කිතු සමිඳු සවිය මා තුළ වනසේ ..."

මෝසැසි පෙරේරා පියතුමාගේ භාෂාව හා භාෂාව හැසිරවීම පිළිබඳව අරිසෙන් අහුබුදු සූරීන්

විසින් ඉතා පැහැදිලිව අගයමින් පියතුමාගේ වටිනා ජීවිතයට විශේෂ වටිනාකමක් එක් කිරීමට කටයුතු කරන ලදී.

**තෙහිලි ගී** (Psalms)

පැරණි ගිවිසුමේ ගීතාවලියෙහි එන ගී අප මාහිමිපාණන් විසින් හඳුන්වනු ලැබුවේ තෙහිලි ගී ලෙසටය. ගීතාවලිය වනාහි හෙබ්‍රෙව් දේවජනතාවගේ නමස්කාරයට හා භාවනා ජීවිතයට අයත් උදාර කෘතියකි. ප්‍රසිද්ධ නමස්කාරය සඳහා අවශ්‍ය ස්තෝත්‍ර සහ පෞද්ගලික යාච්ඤා යන අංග දෙකම මෙහි දක්නට ඇත.

අනික් කරුණ වන්නේ තෙහිලි ගී පිළිබඳ කථා කිරීමේ දී එතුමා ලතින් භාෂාව, ඉංග්‍රීසි භාෂාව යොදාගෙන ලියූ ගීතිකා සැබෑ අයුරින් අධ්‍යයනය කර අප දේශයට, භාෂාවට හා සාහිත්‍යයට මනා සම්බන්ධතාවක් ඇති බව තම නිර්මාණවලින් මොනවට ප්‍රකාශ කර තිබීමයි.

උන්වහන්සේ ගී ගැයුවේ නැත. එහෙත් හද ගැස්ම ගීත රාවයක් ලෙසට හඳුනා ගන්නට එතුමන් ලබා සිටියේ මහා පුදුමාකාර බලයෙකි.

උදා: 1. "එළිය ඔබ මගේ ..."
2. "තුති පුදමි ඔබට සමිඳේ ..."
3. "සමිඳෙ ඔබෙ කුඩාරමේ ... "
4. "කොපමණ රස වෙතිදෝ සමිඳෝ ... "
5. "දෙවියනේ ඔබ ඔබේ සෙනගට
නිබඳ පෙන්වති යහගුණේ ..."

**වෙනත් විවිධ ගී**

උදා: 1."කිතුනි ඔබේ අත්බව මා පිරිසිඳු ..."
2. "ඔබ අදහන්නෝ මා සමිඳේ ..."
3. "රන් දහදිය වගුරා ..."
4. "ලෝකෙට දෙන්න මෙදා ..."
5. "දෙවියෝ වෙති සුළ මුල ප්‍රේමේ ... "

දෙවන වතිකානු මන්ත්‍රණ සභාවෙන් පසුව දේව වන්දනාව නව මං පෙත් ඔස්සේ ගලා යෑම හේතුකොට ගෙන භාෂාවේ වැදගත්කම මනාව පසක් විය. පසුකාලයේ රචනා කරන ලද ගීතිකාවලට එක්තරා ආකාරයක මග පෙන්වීමක්, ආලෝකයක් දෙන්නට පියතුමාගේ හැකිකම්, සුරුකම් බෙහෙවින් උපකාරී වූ බව සිහිපත් කළ යුතු අතර, නව නිපැයුම් කාබන් කොපි ලෙස නිර්මාණය වූයේ නොවේ. එසේම, අප අමතක නොකළ යුතු මහා ගාන්ධර්වයා ලෙස නමක් දරා ඇති මර්සලින් ජයකොඩි නි.ම.නි. පියතුමා පිළිබඳව ද අප සිහි කළ යුතුය. දේව වන්දනාවේ පෝෂණය සඳහා ඉතා මටසිලිටි බවින් හදවතට දැනෙන ලෙස දේව වන්දනා ගීත හඳුන්වා දීමෙහි ලා එතුමන්ගේ මෙහෙවර අති විශේෂ බව මෙහි සඳහන් කර තැබීම වැදගති.

දේව වන්දනාව පෝෂණය කිරීමෙහි ලා සහ ගීතිකාව ඒකාලෝක කිරීමෙහි ලා ඉමහත් වෙහෙසක් දරා පුරෝගාමී වෙනසක් ලබාදුන් මෝසැසි පෙරේරා හා මර්සලින් ජයකොඩි පියතුමන්ලා සැබවින්ම කතෝලික සභාව ලැබූ අති විශේෂ දීමනා බව නම් කිව යුතුය.

**මෝසැසි පෙරේරා මාහිමිපාණන්ගේ ජීවන තොරතුරු**

උපත : 1899 ජුනි මස 07 වැනි දින
නම : මහරගේ මෝසස් පෙරේරා
ගම : දෙහියාගත
පියා : මහරගේ සැමුවෙල් පෙරේරා
මව : කුරුගමගේ මරිය මදලේනා ජයවර්ධන
අධ්‍යාපනය : ගාල්ලේ සාන්ත ඇලෝසියස් විද්‍යාලය
පූජක වරම : 1927 සැප්තැම්බර් මස 05 වැනි දින
පළමුවැනි ඔබට පසස ගී පොත : 1964
මාහිමි පදවිය : 1968
සේවා කළ මීසම් : රක්වාන, බලංගොඩ, පින්නවල, දෙණියාය
පළ වූ ගී පොත් : 08
සග සැපත : 1985 පෙබරවාරි මස 02 වැනි දින

ගරු බෙනඩික් ජෝසප් පියතුමා
**"Evening Star"- Colombo 5**

## චූටිකමට කියන කතා....



දෙයියො කියන්නෙ කවුද කියලා දවසක් අපේ කැම්පස් මාමා මගෙන් ඇහුවා. මං කිව්වා අපේ තාත්තා වෙන්න ඇති කියලා ... එතකොටම අපේ කැම්පස් මාමා ඇහුවා "චුට්ටො උඹ ඒක කොහොමද ඔප්පු කරන්නෙ කියලා. ඉතින් මම එක පාරටම කිව්වා ඇයි අපේ අම්මා දවසක් කියනව මං අහගෙන අනේ මගෙ දියියො මට ඇඳුමක් ගන්න රු. 1000 ක් දෙනවද කියලා" යැයි මට ඉබේටම කියවුණා. ඒත් අපේ කැම්පස් මාමාගේ අදහස් වෙනස් නිසා උඩුහිත, යටිහිත, පෞරුෂ ඔන්න ඔය වගේ වචන ගොඩක් කියාගෙන කියාගෙන ගියා. හැබැයි මට නම් මේ ලෝකෙ දෙයක් තේරුණේ නෑ. ඒත් ඉතින් ඒවා ලොකුවට මට නොතේරුණාට පස්සෙ හිතනකොට නම් පොඩි පොඩි දේවල් ටිකක් මට තේරෙන්න පටන් ගත්තා.

ඉතින් මට හිතුණා ඔව් නේන්නම්, අපේ තාත්තා දෙයියො නම් හවසට කකුල් හතරෙන් එන්න ඕන නැනෙ ... අනික පොඩ්ඩ බැරි වෙද්දි කුණුහරුප කියන එකත් නැනෙ ... ඔහොම හිතාගෙන හිතාගෙන යද්දි මගේ පුංචි මොළේ තවත් ප්‍රශ්නයක් ගැන කරුකුරුවක් මට ම ඇසුණේය. දෙවියන්ට මනුෂ්‍යයෙක් වෙන්න පුළුවන් නම් ඇයි බැරි මනුෂ්‍යයකුට දෙවියෙක් වෙන්න නේද කියලා මට හිතිල අපේ අක්කගෙන් අහන්න ඕන කියලා මම ඒකමතිකවම තීරණය කළා. මොකද අක්කා අපේ දහම් පාසලේ හොඳ ටීචර් කෙනෙක් හින්දා. පපුව ටිකක් ඉස්සරහට දාලා සීරුවෙන් හිටගෙන අක්කාගෙන් මම ඒ ප්‍රශ්නය ඇසුවේ හරියට ටී වී එකේ සුපර් ස්ටාර් කෙනෙක් වගේ කියන්නකො.

අක්කාගේ පළමුවන ප්‍රශ්නය උනේ "උඹට කවුද ඕක මගෙන් අහන්නයි කියල කිව්වේ" යන්නයි. එතකොට මට මගේ කටේ කෙළ හිඳුණ නිසා අම්මගෙන් හරි කෙළ ටිකක් ඉල්ල ගන්න ඕන කියලත් මට හිතුණේය. ඒත් ඉතින් අපේ කැම්පස් මාමා දවසක් මට කිව්ව කතාව ඒ වෙලාවෙම මට සිහිපත් විය. අපේ කැම්පස් මාමා මට කීවේ, " චුට්ටො, ඔය නොදන්න ප්‍රශ්නයක් උඹගෙන් කවුරු හරි ඇහුවොත්, ගම්භීර වචන ගොඩක් උඹ කියාගෙන කියාගෙන පලයන්. හරියට මෙන්න මේ වගේ... සංක්ෂිප්තව විසර්ජනයට භාජනය කරල වික්‍රමාන්විත සැහැසි ජුගුප්සාවක් අතරමං කරන්න මගේ ප්‍රයත්නය නොවේ... " කියල. කිව්ව ඒ වාක්‍ය මට මතක් වෙලා මම කියාගෙන කියාගෙන යන්න පුළුවන් වුණේ හරියටම වචන පහක් හයක් පමණි. එක පාරට ම යාල් දේවි කෝච්චිය මගේ කනේ හැප්පුණා වගේ අක්කා අත දිග ඇරලා දුන්නා මට පිළිතුරු පහරක් යරියට මං හිටියේ කොහේද කියලවත් මට තේරුම් ගන්න බැරි උනා. ඒත් කමක් නෑ කියලා මම නැවත හරියට පිටකොටුවේ හිඟන්නෙක් වගේ වැඳ වැටිලා සමාව ඉල්ලුවා, ඒත් අක්කා කිව්වේ " මම දන්නව උඹත් දැන් හැදෙන්නෙ උඹගෙ කැම්පස් මාමා වගේ නේද" කියලාය.

ඒත් ඉතින් දහම් පාසල් ටීචර් කෙනෙක් නිසාදෝ අපේ අක්කා මට සමාව දී "වර චුට්ටා" කියලා කතා කළේ මගේ කනේ පැහැය වෙනස් වී බලාගෙන ඉන්න කොටම පපඩමක් වගේ කන පිපීගෙන ආව නිසා වෙන්න ඇති. ඒ කොහොම උනත් " ටීචර් අක්කා" මට මුළු මතින්ම දේව ධර්ම පාඩමක් කියලා දුන්නාය.

ඉතින් ඒ අනුව දෙවිකෙනෙක් වෙන්න අපිට බැරි කමක් නැති බව මේ පුංචි මට තේරුණාට අපෙ තාත්තට නම් තාමත් තේරුම් ගන්න බැරුව ඇති ... මොකද මං ඉන්න තැන තාත්තා කුණුහරුප කියන කොට අපේ අම්මා නිතර කියන්නේ, "මේ පොඩි උං ඉස්සරහ ඔය කුණුහරුප කියන එක මොනතරම් පාපයක් ද" කියලාය. එතකොට ම අපේ තාත්තා මට කියන්නේ, "චුට්ටො උඹේ කන් දෙක වහගනින්

නැත්නම් මෙතනින් පලයං" කියලාය. එතකොටම මට තේරුනේ කුණු හරුප කියන එක කොහොමත් පාපයක් නෙවෙයි පුංචි අපිට ඇහෙන එකයි පාපය කියලාය. මං හරිද මන්දා. ඉතින්, මේ විදියට මම ගොඩක් දේවල් ගැන හිතන කොට ගොඩක් මහන්සි වෙලා අපේ හැසිරීම් හදා ගන්න වෙනව කියලා මට හිතුණේය. අපේ බාප්පා කෙනෙක් දවසක් පදමට අරගෙන වැනි වැනී එනකොට කිව්ව සිංදුවක් මට මතක් වුණේය. "මිනිසාමයි ලොව දෙවියන් වන්නේ ... මිනිසාමයි ලොව තිරිසන් වන්නෙ ..." කියන සිංදුව අපෙ බාප්පා දැනගෙන හෝ නොදැනගෙනම බාප්පා ගැන ලොවට කියනවා කියලා මට හිතුණේය. ඉතින් දේවත්වය ගැන හිතන අපට තව මොනව කරන්න පුළුවන් ද කියලා මගේ හිත මට කතා කළේය. අපේ බොහෝ දේවල් අපි මවා පාන නිසාත්, අපි වෙස් මුහුණු පළදින නිසාත් අපට ගොඩක් වැඩ වරදින බව මට සිහි වුණේ අපේ ටීචර් අපේ හැදියාව ගැන එදා රැස්වීමකදී කිව්ව කතා ටික ඇහුණ වෙලාවේදී ය. ඉතින් මේ විදියට බලාගෙන ගියාම අපි කාටත් දෙවිවරු වෙන්න පුළුවන් වෙන්නෙ අභියෝග ජය ගත්තොත් විතරක් කියා මට සිතුණෝය.

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා බංගලදේශයෙ සිට

# කැමිලස් මහතා දිවි ගමනට සමුදෙයි



මෙරට කාටූන් කලාවේ පතාක යෝධයකු වූ කැමිලස් පෙරේරා මහතා දිවියට සමුදී තෙමසක් ගත වී අවසන්ය. එතුමා ඇසුරු කළ බොහෝ දෙනකුට එතුමන්ගේ අවමංගල්‍යයටවත් සහභාගි වීවට ඉඩක් නොතබා කැමිලස් මහතා සමුගෙන ගියේය. මියගියාට පසු කරන ඇගයීම්, වර්ණනා, ප්‍රශංසා ප්‍රතික්ෂේප කළා වැනිය. සිය කාටූන් තුළින් මේ සමාජයේ දුර්වලතා වලට පහර පිට පහර ගැසූ කැමිලස් මහතාගේ පරමාර්ථය වූයේ මේ රට තුළ යහපත් සමාජයක් ගොඩනැගී මය. සිරිබිරිස්, සෙල්ලං සේන, තේපානිස්, ලපයා, ඇතුළු කාටූන් චරිත රාශියක් තුළින් සිය පණිවුඩය සමාජයට ගෙනගිය කැමිලස් මහතා භක්ති ප්‍රබෝධනය සඟරාවට දායක වූයේ මාසික සුළිය කාටූනය සමගිනි. ඒ මහතා මේ රටේ කිතුනු පුවත්පත් සඟරා වලට කාටූන් ඇඳීම ආරම්භ කළේ 2003 වසරේ එවකට 'භක්ති ප්‍රබෝධන' සංස්කාරක ගරු ජස්ටින් සිල්වා නි.ම.නි. පියතුමාගේ ආරාධනයකට අනුවය. 2003 වසරේ සිට 2018 වසර දක්වා පුරා වසර පහලොවක් ප්‍රබෝධනයට කාටූන් ඇඳි ඒ මහතා සිය කාටූන් නිර්මාණවලින් සමුගත්තේ සිය ආදරණීය බිරිඳ මියගියාට පසුවය. මේ රටේ ජාතික පුවත්පත් තුළින් වඩ වඩාත් ජනතා ආකර්ෂණය දිනාගත් කැමිලස් මහතා වසර පනස් හතරක් තිස්සේ තම තෙලිතුඩින් මේ සමාජය යහපත් තැනක් කිරීමට කළ සේවාව, විශිෂ්ටය, සදානුස්මරණීයය. 'භක්ති ප්‍රබෝධනය' සංස්කාරක පියතුමන්, කාර්යය මණ්ඩලය හා ලේඛක පාඨක සියලුදෙනා සමඟ එක්ව කැමිලස් මහතාට අපි මොක්සුව ප්‍රාර්ථනා කරමු.




වී. සුනිල් ප්‍රනාන්දු සහ රූපස් ප්‍රැන්සිස්

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



සුදු වැලි ගෙමිදුල පුරා තැනින් තැන හැඩට පිපී තිබුණු සුවඳ මල් ගෙන දෙන්නේ අමුතුම මිහිරකි. මිදුල පුරා විහිද ගිය කුඩා තුරු අතරේ ගෙනෙන සිසිල නිසාම කඩුල්ලෙන් ඇතුළු වන විට ලැබෙන සැහැල්ලුව සිත නිවන්නේය. සුදු හුණු ගා පිරියම් කළ කුඩා නිවසත් ඒ අද්දරම හිනැහෙන 'සමන්දරා clothing' පුංචි මැහුම් හලත් ජීවිතය ගැන කියා දෙන්නේ වෙනස්ම කතාවකි. මේ දිරිය කතාව ගෙනෙන්නට කලින් ඔබේ සිතින්, ඔබව එහි ගෙන යන්නට සිතුවේ එහි අපුරුතම බව නිසාම ය. මේ මැහුම් හල දිරිය දියණියකගේ, දිරිය පුතණුවකුගේ සහ දිරිය මවකගේ සුවඳ දා බිඳු මුසු වූ කතාවකි. එය හිරු මෙන් ආලෝකවත් ය. සඳ මෙන් අඳුරු මොහොත පවා බබළවන්නේය. තරු මෙන් හැමදාම දිදුලන්නේ ය. ඉතින් දුවේ, පුතේ මෙය කියවා ඔබටත් ජීවිතය ඉගෙන ගත හැකි බව මම විශ්වාස කරමි.

පියාගේ වෙන්වීමත් සමග අම්මාත් දරු දෙදෙනාත් ජීවිතය නවතා නොදැමිය හැකි බවත් වීරියෙන් එය නැගිටුවා ඉදිරියට ගෙන ගිය යුතු බව සිතන්නේ එක සිත් ඇතිවය. එහෙත් සවිමත් හදවතක් ඇතිව නැගිටින්නට ගත් පළමු පියවරේ දී ම මහා කුණාටුවක් සේ ආ අම්මාගේ වේදනාබර රෝගී තත්ත්වය සියලු පැතුම් විසිරුවා හරින්නට විය. දරුණු පිළිකා රෝගයක් අම්මට වැළඳී ඇති බව දැන ගත් මේ දරු දෙදෙනාගේ හදවත කෙසේ නම් දැවී යන්නට ඇත්ද ... නමුදු එවන් ශෝකයකට තම ජීවිත බිඳ දමන්නට ඉඩ නොදිය යුතු බව පරම අරමුණ කර ගත් දරු දෙදෙනා ඉදිරි පියවර තබන්නට කිසිවිට බිය නොවිය. අම්මා පිළිකා රෝහලෙන් දිගින් දිගටම ප්‍රතිකාර ලබන අතර පුතා අ.පො.ස (සා .පෙළ) විභාගය සඳහා සුදානමින් සිටියේය. දියණිය පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා සුදානමින් සිටියාය. ගමන කෙසේ දුෂ්කර වුවද දරු දෙදෙනා කිසිවිට බලාපොරොත්තු අත හැර දැමුවේ නැත . ජේසුගේ දිව්‍ය ආදරය ඔවුන්ගේ ජීවිත වල එකම ආලෝකය බව විශ්වාස කර ඔවහු ඉදිරියටම ගියෝය. වේදනා ඇති මුත්, ඒ කිසිත් නැතුවා සේ හිනැහෙන අම්මා ගේ සිනා මුහුණත් ඔවුන්ගේ මහා ශක්තිය විය. ඒ ආලෝකය හා ශක්තිය ඒ ජීවිත සැබවින්ම ආශීර්වාද කළේය. පුතා, විභාගය ඒ සාමර්ථ්‍ය 9 ලබා විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළේය. දියණිය අමතර පන්ති කිසිවකට නොගොස් ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වූවාය. දුෂ්කර ගමනක වෙහෙස දේව ආදරය තුළ කෙතරම් පහසුද යන්න මේ දරු දෙදෙන හැම මොහොතකම අපට කියා දෙති. ගමන තවත් ලස්සණ වන්නේ මින් ඉදිරියටය. අම්මා දිගින් දිගටම ප්‍රතිකාර ලබා ගත යුතුය. දරුවන් දෙදෙනා ගේ එකම බලාපොරොත්තුව ඉගෙනීම තුළ ඉදිරියට යමින් හෙට දවස අම්මා වෙනුවෙන් ආලෝකවත් කිරීමය. එම නිසා ඉදිරි ගමන පැහැදිලි විය යුතුය. ආර්ථිකය ගොඩ නගා ගත යුතුය. තම දැතේ සවියෙන් නැගිටීම ඔවුන්ගේ එකම අරමුණ විය. ධෛර්යවන්ත අම්මා කෙනෙක් මේ දරු දෙදෙනාගේ සෙවනැල්ල වීම ඔවුන් ලද වරප්‍රසාදය විය. හැඩට වැඩට අඳින්නට අපුරු විලාසිතා අනුව ඇඳුම් මසන්නට අම්මා දක්ෂ නිසා, ඇයට හයියක් වෙමින් 'සමන්දරා clothing' මැහුම් හල බිහි විය. වෙහෙස දරා, නිදි වරා, කුස ගිනි දරා, බොහෝ කැපකිරීම් මැද එය බිහිවිය. අද එය, තවත් තරුණ දරුවන් ට රැකියා ස්ථානයක් ද විය .


කිසිවිට දරු දෙදෙන තම ඉගෙනුම් ගමන අමතක නොකළහ. අ. පො. ස. (උ. පෙළ.) ගණිත අංශයෙන් ඉගෙන ගැනීමට යොමු වූ පුතණුවන් පවුලට තවත් දිරියක් වීමේ අරමුණින්, ඡායාරූපකරණය පිළිබඳ ඉගෙනුම ලැබ විවිධ සුවිශේෂ අවස්ථා ඡායාරූප ගත කිරීමේ පුංචි රැකියාවක ද නියැලෙමින් සිටින්නේය. අධ්‍යාපනය සඳහා වැයවන අධික බරට ඔහු දායක වන්නේය. දියණිය පාසල් වේලාවෙන් පසු මැහුම් හලේ වැඩට උදව් කරන්නීය . සියල්ල සමබරව ගෙනයමින් තම වෙහෙස තුළ ජීවිතය ගොඩ නගන මේ දරුවෝ සැම මොහොතකම අපට අලුත් පාඩමක් කියා දෙන්නෝය .... ඔවුන් තුළ මෙතෙක් මා දුටු විශේෂ ගුණාංග බොහොමයකි. ඒ සියල්ල තුළ දේව ආදරය විහිදෙන බව මට දැනෙන්නේය.

යොවුන් වයසේ සිටින පුතණුවන්, හැකි සැම මොහොතකම අම්මා සමග මහරගම අපේක්ෂා රෝහලට ඇගේ ප්‍රතිකාර සඳහා යන්නට අමතක නොකරන්නේය. ඒ දිනවල පාන්දර පිටත් වන ඔවුන් නැවත නිවසට පැමිණෙන්නේ අඳුර වැටෙන යාමයේ ය. අම්මා දැඩි වේදනාවන් පෙළෙන දවස් බොහෝ නිසා, පාසල් යන්නට පෙර 'බෙහෙත් ටික වෙලාවට බොන්න. ඔයාව අපට ඕනා ....' යනුවෙන් ලොකු අකුරින් ලියූ කොළයක් අම්මගේ ඇඳ අද්දරින් ගසා යන්නට පුංචි දියණිය කිසිදින අමතක නොකළාය. දිව්‍ය පූජාව, දහම් පාසැල, ළමා සමිතියට සහභාගී වීම කිසි විටකත් ඔවුහු අමතක නොකළහ. ඒ තුළ ගොඩ නැගෙමින් ජේසුගේ ආදරය බෙදා දෙන විසල් තුරු සේ මේ මොහොතෙත් ඔවුන් ගොඩනැගෙ මින් ඇත. ඇති දේ තුළ පුදුමාකාර සතුටක් ලබන්නටත්, කිසි දෙයක් හමුවේ මැසිවිලි නොකියන්නටත්, බොහෝ අරුත්බර දේ නිතරම සොයන්නටත් රස විඳින්නටත් විශේෂයෙන් පොතට පතට ලැදිව ජීවත් වන්නටත් මේ දරු දෙදෙනා පුරුදු පුහුණු වී සිටින්නේ මහත් වූ ආශීර්වාදයක් ලෙසය. දුෂ්කරම තැන පවා අපුරුවට සිනහ වෙමින්,

**ජීවිතය යනු කිසි විටකත් විඳවිය යුත්තක් නොව විඳිය යුත්තක් බව, මේ පොළොව මත ජීවත් වෙන සැම දරුවකුටම අපූරු පාඩමක් කියා දෙන මේ ජීවිත ඇසුර දුවේ, පුතේ ඔබේ ජීවිතයට ආලෝකයක් කරගන්න.**

**නිසංසලා සඳමාලී, වෙන්නප්පුව**

## ප්‍රහේලිකා අංක - 78



**පහළට**

1. පෙබරවාරි දෙවන දින අප සමරන මංගල්‍යය
2. දේව ප්‍රසාද නිධාන මගින් දෙවියන් වහන්සේගේ ......... අප වෙත ගලා එයි
3. "ආසන්න" යන්නට සමාන අරුත් දේ
4. "යදිනවා" යන්නෙහි පූර්ව ක්‍රියා පදය
5. දේව වන්දනාවෙහිදී භාවිත වේ
8. ග්වාඩලූපේ දර්ශනය අත් දුටු පුද්ගලයාගේ නමෙහි කොටසක්
10. ඉශ්‍රායෙල් ජනතාව බැබිලෝනියේ ගත කළ කාලය
12. යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් ජලයට නුදුරින් වාසය කරන සෝෂාකාරී හඬක් නංවන පක්ෂියකි
14. "Canon Law" යනු ...... නීතියයි
15. ශුද්ධවන්තයන්ගේ ශරීරවල නොදිරූ කොටස්
16. "අලුත්"
18. මූලද්‍රව්‍යයන්ගේ ලක්ෂණ අනුව ඒවායේ පරමාණුක ක්‍රමාංක වැඩි වී යන පිළිවෙලට වර්ග කර දක්වන වගුව
20. රටක පවතින විධිමත් දේශපාලන ඒකකය
22. ධාතුවකට අගින් අර්ථවත් ප්‍රත්‍යය යෙදී සෑදෙන්නාවූ පද
23. ඉන්දියාවේ දේශපාලනික කේන්ද්‍රස්ථානය
24. යාච්ඤාවේ අවසානයේ යෙදෙන "එසේම වේවා" යන අරුත් ඇති පදය
25. රුපියලකින් සියයෙන් කොටස
26. කුඩා පර්වතය ගල යන්නට සමාන අරුත් දේ
27. "අපි" යන්නෙහි අනුක්ත රූපය

**හරහට**

1. මාස 4 ක කාලපරිච්ඡේදය
3. ශුද්ධවූ සභාවේ නිල යැදුම
6. වර්ණයකි
7. පුද්ගලයෙකු කෙරෙහි ඇති අකමැත්ත
9. ජන රසාස්වාදන අංගයකි
11. ජපානයේ අගනුවර
13. දේව වන්දනාවේ ප්‍රධාන අංග තුනෙන් එකකි
17. පුරාණ ඉන්දියාවේ පැවති රාජ වංශයකි
18. භික්ෂූන් ලැගුම් ගන්නා ස්ථානය
19. බිළිඳු ජේසු වෙත රජුන් පිදූ ද්‍රව්‍යයකි
21. වාසය කරන
24. අවවාදයට වඩා උතුම් වේ
26. ක්‍රියා විශේෂණයකි
27. විශාල හා දැවැන්ත යන්නට සමාන වචනයකි
28. බැංකොක් අගනගරය වන රට
29. ඕනෑම වස්තුවක බාහිර පෙනුම, හැඩය, ආකාරය, ස්වරූපය, ආකෘතිය මේ නමින් හැඳින්වේ.

සැකසුම :

**ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා**

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, 2024 අප්‍රේයල් 30 ට පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00 බැගින් පිරිනැමේ. *විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.*

**ප්‍රහේලිකා අංක - 78**

**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 76 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 ජ | ත් | 2 ම | ය | ■ | 3 දි | 4 ව | ං | 5 ශ | ක |
| න | ■ | ක් | ■ | 6 ක | ච | දු | ■ | ව | ■ |
| 7 ප්‍ර | 8 පා | ක | ය | ■ | ්‍ය | ■ | 9 බෙ | ලෙ | ක් |
| 10 වා | ස | ල | ■ | 11 වි | ස | ■ | ■ | න | ■ |
| 12 දු | ල | ■ | ■ | 13 න | ත් | ක | ල | ■ | 14 ම |
| ■ | ■ | 15 පා | ළි | ■ | ප්‍ර | ■ | ■ | 16 ව | ළ |
| 17 එ | ට | නා | ■ | 18 ආ | සා | 19 දි | 20 ක | ■ | ■ |
| ඩේ | ■ | ■ | 21 ම | ර | දු | ග | හ | මු | 22 ල |
| 23 රු | 24 පි | ය | ල් | ■ | 25 ය | ම | න් | ■ | යි |
| ■ | ල | ■ | 26 මී | න | ■ | ■ | චි | ■ | කා |

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 76 ජයග්‍රාහකයෝ

දයාබර දරු දැරියනි,

ප්‍රහේලිකා අංක 76 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම් සඳහන් දරුවෝ ජයග්‍රහණය කර ඇත. සහභාගි වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභීන්ට ඔබේ ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ඔබට ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ දරුවෝ**

- **පළමු ස්ථානය** - ඉමෙත් ගෙත්මිර - 7 එච්, මාරිස්ටෙලා විදුහල, තිඹිරිගස්කටුව.
- **දෙවන ස්ථානය** - ජේ. ඩී. හෙප්සිමා, 6 ජේ, මිනු/දූනගහ රණසිංහ ජාතික පාසල, දූනගහ.
- **තෙවන ස්ථානය** - යෝෂේන් කරුණානායක, 7 වසර. ශා. පීතර විදුහල, කොළඹ 04.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2024 මැයි / ජුනි - "පල්ලියේ මංගල්‍යය"**
(මැයි - ජුනි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 15 ට පෙර අප වෙත එවන්න.)
**2024 ජුලි / අගෝස්තු - "බලය"**
(ජුලි - අගෝස්තු කලාපය සඳහා ඔබ එවන ලිපි මැයි 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය

## අ. පො. ස. (සා/පෙළ) විභාගය - 2024

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - I

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය කුමක් ද?
(i) මහෝපදේශය (ii) ශුද්ධ බයිබලය (iii) ඩිඩාකය (iv) යාච්ඤා නිධානය

(02) ශුද්ධ බයිබලයේ ප්‍රධාන කර්තෘ කවු ද?
(i) මිනිසා (ii) මෝසෙස් තුමා (iii) ආබ්‍රහම් තුමා (iv) දෙවියන් වහන්සේ

(03) පුරාණ ගිවිසුමට අයත් ජනප්‍රිය ඓතිහාසික කෘතියක් නම් කරන්න.
(i) ජුදා කතාව (ii) ජෝෂුවා කතාව (iii) එස්තර් කතාව (iv) ගණන් කතාව

(04) කතෝලික ධර්මයේ පදනම කුමක් ද?
(i) දේව වචනයයි (ii) දේවස්ථානයයි (iii) ශුද්ධවන්තයන් (iv) අපෝස්තුළුවරුන්

(05) ශ්‍රීමත් තියෝපිලස් තුමන්ට තම ග්‍රන්ථය පිළිගැන් වූ සුවිශේෂක කතුවරයා කවුද?
(i) ශු.ජොහාන් තුමා (ii) ශු.මාක් තුමා (iii) ශු.ලූක් තුමා (iv) ශු.මතෙව් තුමා

(06) නව ගිවිසුමේ ඇති හසුන් සංඛ්‍යාව කීයද?
(i) 21 (ii) 18 (iii) 13 (iv) 8

(07) විවිධ සංසවලට හා පුද්ගලයන්ට ලිපි ලියා ඇත්තේ කවු ද?
(i) ශු. පේදුරු තුමා (ii) ශු. ජොහාන් තුමා (iii) ශු. පාවුලු තුමා (iv) ශු. තියෝපිලස් තුමා

(08) කොලොස්සි නුවර බොරු ගුරුවරුන් වැරදි ඉගැන්වීම් කර ඇති නිසා ඒවා නිවැරදි කිරීම සඳහා ලිපියක් ලියන ලද්දේ කවුරුන් විසින් ද?
(i) ශු. ජාකොබ් තුමා (ii) ශු. පාවුලු තුමා (iii) ශු. පේදුරු තුමා (iv) ශු. ජෙරොම් තුමා

(09) යහපත් හා අයහපත් බලවේග අතර ගැටුමක් පෙන්නුම් කිරීම ගැන කතා කරන එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ කුමක් ද?
(i) යුගාන්ත වාදය (ii) සංකේත භාවිතය (iii) ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීම. (iv) ද්විත්ව වාදය

(10) දේව ආදරයේ ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ හා අපගේ ගැලවීමේ සංකේතය කුමක් ද?
(i) බැටළුවා (ii) කුරුසිය (iii) ඉටි පහන (iv) ජලය

(11) එළිදරව්ව ග්‍රන්ථයේ කර්තෘත්වය ආරූඪ කර ඇති අපෝස්තුලුවරයා නම් කරන්න.
(i) ජාකොබ් අපෝස්තුලුවරයා (ii) පේදුරු අපෝස්තුලුවරයා
(iii) ජොහාන් අපෝස්තුලුවරයා (iv) මතෙව් අපෝස්තුලුවරයා

(12) විශ්වයේ හා මිනිසාගේ ආරම්භය ගැන සඳහන් පොත නම් කරන්න.
(i) නික්මයාම පොත (ii) ගණන් කතාව පොත (iii) ජෝෂුවා පොත (iv) උත්පත්ති කතාව

(13) පරම්පරාගත විශ්වාසය සහ අත්දැකීම් පදනම් කරගෙන සකස් වී ඇත්තේ කුමක්ද?
(i) පංච පුස්තකය (ii) එළිදරව් සාහිත්‍යය (iii) සුවිශේෂ (iv) ගීතාවලිය

(14) දර්ශන, සිහින හා දේවදූතයන් මගින් දෙවියන් වහන්සේ මිනිසාට කතා කරන්නේ කුමන සම්ප්‍රදාය තුළද?
(i) යාහවේ සම්ප්‍රදාය (ii) පූජක සම්ප්‍රදාය (iii) එලෝහිම් සම්ප්‍රදාය (iv) ද්විතීය නීති සම්ප්‍රදාය

(15) දෙවියන් වහන්සේ සඳහා කැප වූ ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීම ගැන අවධාරණය කරන්නේ කුමන සම්ප්‍රදාය තුළද?
(i) එලෝහිම් සම්ප්‍රදාය (ii) පූජක සම්ප්‍රදාය (iii) යාමේ සම්ප්‍රදාය (iv) ද්විතීය නීති සම්ප්‍රදාය

(16) දේව මාලිගාවේ දී සෙරාප්වරුන් පිරිවරා සිටි දර්ශනය තුළින් කැඳවනු ලැබූ දිවැසිවරයා වන්නේ,
(i) එසකියෙල් (ii) ජෙරමියා (iii) යෙසායා (iv) හොසියා

(17) ''මට විරුද්ධව කැරලි ගැසූ කැරලිකාර ජාතියක් වන ඉශ්‍රායෙල්වරු වෙත මම නුඹ යවමි'' දෙවියන් වහන්සේ එසේ පවසමින් දිවැසිවර කැඳවීම භාරදුන් දිවැසිවරයා කවුද?
(i) ජෙරමියා (ii) නාතාන් (iii) හුල්දා (iv) එසකියෙල්

(18) ''මහෝත්තම ස්වාමීන් වහන්ස, මා ලාබාලයකු වන බැවින් මම කතා කරන්නට නොදනිමි.'' මෙසේ පවසන ලද්දේ.
(i) ජෙරමියා දිවැසිවරයා (ii) යෙසායා දිවැසිවරයා (iii) හොසියා දිවැසිවරයා (iv) එසකියෙල් දිවැසිවරයා

(19) දේශක දිවැසිවරුන් අයත් නිවැරදි පිළිතුර තෝරන්න.
(i) නාතාන්/යෙසායා/මුලාකි (ii) එලියා/එලීෂා/හුල්දා
(iii) එලියා/අහියා/එසකියෙල් (iv) යෙසායා/ජෙරමියා/එසකියෙල්

(20) ''මව් කුසේ පිළිසිඳ ගැනීම ඇති කරන්නට පෙර පටන් සමිඳාණන් වහන්සේ කැඳවූ දිවැසිවරයා කවුද?
(i) යෙසායා දිවැසිවරයා (ii) ආමෝස් දිවැසිවරයා (iii) ශෙපනියා දිවැසිවරයා (iv) ජෙරමියා දිවැසිවරයා

**පිළිතුරු**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | iii | (06) | i | (11) | iii | (16) | iii |
| (02) | iv | (07) | iii | (12) | iv | (17) | iv |
| (03) | iii | (08) | ii | (13) | i | (18) | i |
| (04) | i | (09) | iv | (14) | iii | (19) | ii |
| (05) | iii | (10) | ii | (15) | ii | (20) | iv |

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

සැ. යු . විශ්ව සභා ඉතිහාසය ලෙස පසුගිය සඟරාවේ පළවූ ලිපියේ මාතෘකාව (පිටුව 31) නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම I - ලෙස නිවැරදි විය යුතු බව කරුණාවෙන් සලකන්න

## නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම II

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## නව ගිවිසුම් සමයේ ජුදා සමාජ ප්‍රභේද

නව ගිවිසුම් සමාජීය පසුබිමේ අයකැමියන් (බදු අයකරන්නන් සුංගම් අයකරන්නන් හා ලෙවීවරුන්) සම්බන්ධව හා කාන්තාවන් පිළිබඳව පසුගිය කලාපයෙන් සාකච්ඡා කර ඇත. මේ ලිපියෙන් ජුදා සමාජ පසුබිමේ අනෙකුත් කණ්ඩායම් කවරේද යන්න පැහැදිලි කෙරේ. පලස්තීන ජුදාවරුන් ප්‍රභේද 5 කි. 1. කුලීනයන් 2. මධ්‍යම පංතිය 3. කොන්කරනු ලැබූවන් 4. විසිරී ගිය ජුදාවරුන් 5. අන්‍ය ජාතීන්. ඒ සියලු කණ්ඩායම් පලස්තීන සමාජ සමග සබඳතා පැවැත්වූ අය වෙති.

### කුලීනයින්

හෙරෝද් රජ පවුල සමග සබඳතා පැවැත්වූ සහ මහා පරිමාණ ව්‍යාපාරිකයන්, ඉඩම් හිමි ප්‍රභූවරුන්, ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් යන ධනවත්, බලවත් පිරිස් ඒ කණ්ඩායමට එක්වෙති. ධනවතුන්ට භාර්යාවන් කිහිප දෙනකු වුවද සිටිය හැකි බවට මිෂ්නා සහ තාල්මුට් නීති මගින් අවසර දී තිබුණි. ධනවත්තු තම පොහොසත්කම පෙන්වීමට ඉස්තරම් සළු පිළි පැළඳූහ. නිතර නිතර භෝජන සංග්‍රහ පැවැත්වූහ. ධනවත් පූජකවරු තම බිරින්දෑවරුන් දේවමාලිගාවට හෝ සිනගෝගයට යාම සඳහා පාවඩ එලූහ. මොවුන් අතර පරිසිවරු හා විනයධරයෝ, සද්දූසිවරු, හෙරෝදිවරු සහ පූජකයෝ යන සමාජ කණ්ඩායම් ප්‍රධාන වෙති.

### පරිසිවරු හා විනයධරයෝ

විනයධරයකු වන්නේ පරිසිවරුන් අතුරින් අවබෝධයෙන් මුහුකුරා ගිය අත්දැකීම් බහුල ව්‍යවස්ථාව උගත් පුද්ගලයෙකි. ඒ නිසා සෑම විනයධරයෙක්ම පරිසිවරයෙක් වේ. එහෙත් සෑම පරිසිවරයෙක්ම විනයධරයෙක් නොවේ. පරිසි යන වදන හෙබ්‍රෙව් බසින් 'පරෂ්' ලෙස ව්‍යවහාර වේ. එහි අර්ථය වන්නේ අන් ජනසමාජයෙන් වෙන්වී සිටින පිරිසක් යන්නයි. ඔවුහු ජුදා ජනතාව අතර වෙන් වී ජීවත්වන පිරිසක් බව ජනතාවට ඇඟ වූහ. ජුදා සමාජයෙන් මෝසෙස්ගේ නීතිය ලියා තැබීම මොවුන්ගේ කාර්යය විය. ලිඛිත නීතිය හෙවත් 'ටෝරා' සහ වාචික නීතිය 'මිෂ්නා' යන නීති පද්ධති දෙකක් අනුගමනය කිරීමට ජනතාවට බල කළහ. ඒ නීති සාමාන්‍ය ජනතාවට ගෙන දුන්නේ පීඩාවකි. මොවුන්ගේ විශේෂ ලක්ෂණ වූයේ

- දේවදූතයන්, මියගිය අයගේ නැගිටීම හා ආත්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළහ.
- දාවිත් රජතුමාගේ රාජ්‍ය වංශයෙන් මෙසියස් තුමා රජකු ලෙස පැමිණේයැයි බලාපොරොත්තුවූහ.
- පාරම්පරික හා සාම්ප්‍රදායික සියල්ල රැක ගැනීමට වෙහෙස දැරූහ.
- ඔවුන් පැළඳුවේ දාවල්ල පළල් සළුපිළිය.
- අන් අයට පෙනෙන සේ මංසන්ධිවලට ගොස් යාච්ඤා කළහ.
- තම දෑත්වල අල්ලේ හා නළලත මත දේව වාක්‍යය සටහන් කළහ.
- සබත් නීති අකුරටම පිළිපැදූහ.

පරිසිවරුන්, ජුදාවරුන්ව වෙනත් රජවරුන් පාලනය කිරීමට විරුද්ධ විය. ඔවුන් පෙන්වා දෙන්නේ තමන්ගේ රජු දෙවියන් වහන්සේ බවයි. එසේම මෝසෙස්ගේ ව්‍යවස්ථාව අකුරටම පිළිපැදූහ. ඒ නිසා, ව්‍යවස්ථාවේ ජනයා, යයි ඔවුන්ව හැඳින්වූහ. ජුදා මන්ත්‍රණ සභාව වූ සෙන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකයන් ලෙසද කටයුතු කළහ. එසේම ක්‍රිස්තුස්වහන්සේ කුරුසපත් කිරීමට මොවුහු හේතුකරුවෝ වූහ. මොවුන් අතර ප්‍රථම විනයධරයා වූයේ එස්රා යැයි හැඳින්වේ.

### සද්දූසිවරු

සද්දූසිවරුන්ගේ ප්‍රභවය පිළිබඳ ඉඟියක් පහළ වන්නේ දාවිත් සහ සලමොන් රජ දවසේ සිටය. ඒ යුගයේ පූජක සේවාවේ යෙදී සිටි සදොක් නමැති පුද්ගලයාගේ පරපුරෙන් සද්දූසිවරුන් පැවත

එන බව කියවේ. මොවුහු ජුදා සමාජයේ ධනවත්, කුලවත්, උසස් පිරිසකි. මොවුන්ගේ ධාර්මික ප්‍රතිපත්තියට අනුව ශුද්ධ ලියවිල්ලේ පංච පුස්තකය පමණක් පිළිගත්හ. මරණයෙන් පසු නැවත නැගිටීම, අවසාන විනිශ්චය මෙසියස්තුමාගේ පැමිණීම, ආත්මයේ අමරණීයත්වය, දේවදූතයන් යනාදි සත්‍යතා පිළිනොගත්හ.

තමන්ගේ පෞද්ගලික වාසිය තකා ක්‍රිස්තුස් වහන්සේව මරණයට පත්කිරීමට වෙහෙසවී කටයුතු කළහ. සැම අවස්ථාවකදී ජෙරුසලම් දේව මාලිගාවේ උත්තම පූජක තනතුර හිමි වූයේ සද්දූසිවරුන්ටය. සද්දූසිවරුන් වාචික සම්ප්‍රදායේ පැවතුන 'මිෂ්නා' නීතිය ප්‍රතික්ෂේප කළේය. ඔවුන් පිළිගන්නා ලද්දේ ලිඛිත නීතිය පමණි. විශේෂ දේශපාලන, ආර්ථික හා ආගමික බලයත් ජුදා සමාජය තුළ ඔවුන්ට හිමි විය. ඒ බලය තහවුරු කරගැනීමේ අපේක්ෂාවෙන් රෝම අධිරාජයාට ඉතා පක්ෂපාත වූහ.

ක්‍රි.පූ. 200 පමණ ටොලමිවරුන්ගේ පාලනය ගිලිහී ගොස් සිරියානු රජකු වූ ඇන්ටියෝක් රාජ වංශයේ IV ඇන්ටියෝක් එපිපානස් පලස්තීනයේ රාජ්‍ය බලය අත්පත් කරගති. ඒ යුගයේදී ඉහත පෙන්වා දුන් සදොක් පරපුරේ අය තමන් සද්දූසිවරුන් ලෙස හඳුන්වා දී ඇත. සිව්වන ඇන්ටියෝක් එපිපානස් සාදොක් පරපුරට අයත් උත්තම පූජක තනතුර අහිමි කරමින් වෙනත් ජාතිකයන්ට ඒ තනතුර ලබා දුනි. ඒ තීරණයට රජුට විරෝධය පලකරමින් ඔවුන් සතු ශුද්ධ ලියවිලිද රැගෙන ඒ පිරිස මළ මුහුදින් වයඹ දෙසට පිවිසියහ. ඒ ප්‍රදේශය හැඳින්වූයේ කුම්රාන් ලෙසය. එහිදී ඔවුන් තමන්ව හඳුන්වා ගත්තේ එසේනිවරුන් නමිනි. ක්‍රි.ව. 70-71 දී පමණ ඇතිවූ ජුදා රෝම කැරැල්ල අවස්ථාවේදී සද්දූසිවරුන්ගේ පැවැත්ම අහෝසි වූ බව සඳහන් වේ.

**හෙරෝදිවරු**

මහ හෙරෝද් රජට පක්ෂපාතව සිටි දේශපාලන කණ්ඩායමකි. එවකට පලස්තීනය පාලනය කරන ලද්දේ රෝම අධිරාජයා විසිනි. අධිරාජයා සතු බලය වක්‍රව භාවිත කරමින් වැඩි වාසි සහ ප්‍රයෝජන ගැනීමට රෝම පාලකයන්ට පක්ෂපාතව සිටියහ. මේ පිරිස ආරම්භය හෙරෝද් පෙළපතින් හෝ ඔහු අනුගමනය කළ අයගෙන් පැවතිණ. ක්‍රිස්තුස් වහන්සේට එරෙහිව කටයුතු කළ පිරිසකි.

**පූජකවරු**

ජාකොබ්ගේ පුත්‍රයන් 12 දෙනාගෙන් ආරම්භ වූ ඉශ්‍රායෙල් ගෝත්‍ර අතරින් ලෙවී නම් පුතාගෙන් බිහිවූ ආරොන්ගේ සහ සාදොක්ගේ වංශයෙන් පමණක් ඉශ්‍රායෙල් පූජකවරුන් පැවතිනි. ඒ පූජකවරු කොටස් 3 කි.

1. උත්තම පූජකවරයා
2. නායක පූජකවරු
3. පූජකවරු

ජුදා මන්ත්‍රණ සභාවේ ප්‍රධානයා උත්තම පූජකයා වේ. මොවුහු ධනවත් පිරිසකි. දේව මාලිගාවේ පරිපාලන වගකීම හා ව්‍යවස්ථාව සම්බන්ධව ප්‍රධානයා මොහුය. යාග පූජා ආදි ප්‍රධාන මංගල්‍ය අවස්ථාවල දේව මාලිගාවේ අතිශුද්ධ ස්ථානයට පිවිසීමට බලය ඇත්තේ මොහුට පමණි. ක්‍රිස්තුස් වහන්සේව මරණයට පත්කිරීමට පිලාත් වෙත ඉදිරිපත් කළේ උත්තම පූජකයාය. එවකට සිටි උත්තම පූජකයා වූයේ ජෝසප් බෙන් කයිපාස් නැමැත්තෙකි. (ක්‍රි.ව. 18-36)

නායක පූජකවරු 71 දෙනෙක් ජෙරුසලම් දේව මාලිගාවේ සේවයේ නිරත වෙති. මොවුන් අතර ප්‍රධානයා උත්තම පූජකයාය. නායක පූජකවරු දුම් පූජා කිරීම වැනි කටයුතු වල නිරත වෙති. නායක පූජක පදවිය පරම්පරාවෙන් උරුම වන්නකි. නායක පූජක ලෙස පත්වූ අයෙක් තම දිවිය පුරාම නායක පූජකයෙක් වේ. විශ්‍රාම ගනු ලැබුවත් ඒ පදවිය අහෝසි නොවේ.

පූජකවරු බොහෝ ප්‍රමාණයකි. වසරකට සති දෙකක් දේව මාලිගාවේ කටයුතු වලට සම්බන්ධ වීමට ඔවුන්ට හැකියාව ලැබිණ. පූජකවරුන් අතුරින් නායක පූජකවරු තෝරා ගැනෙති. නායක පූජකවරු අතුරින් උත්තම පූජකයා පත්වේ. ඒ තනතුර අධික ආදායම් ලබන තනතුරකි. දේව මාලිගාවට පුදන පඬුරු හා සතුන් වෙළඳාමෙන්ද විශාල ආදායමක් ඔවුහු ලබති.

සටහන

**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**




BCI

Aspire to Inspire


# THE MOST BEAUTIFUL PRIVATE GREEN CAMPUS

LOCATED IN A COASTAL CITY IN SRI LANKA!

**MARCH 2024 INTAKE NOW OPEN!**







## Key Features

- UGC Recognized Degrees
- Approved by the Ministry of Education
- Eminent Lecture Panel
- Language Skills Development
- Personality and Skill Development
- State-Of-The-Art Facilities

For More Information


070 60 35 100

031 20 35 100

BCI NEGOMBO

WEBSITE

www.bci.lk | info@bci.lk




මිල රු.100/-
(සහන මිල)

DOP/NEWS/01/2024